ක්‍රිස්තුස් වහන්සේගේ

# පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

"ස්වකීය දෙවියන් කොට ස්වාමීන් වහන්සේ අතුව සිටින ජාතියද, උන්වහන්සේ විසින් ස්වකීය උරුමයකොට තෝරාගත් සෙනඟද, ආශිර්වාද ලද්දෝය." (ගීතාවලිය 33:12)

76 වන වෙළුම අංක 10 (910) 2017 ඔක්තෝබර්

# ඇමරිකාව නැවත දෙවියන් වහන්සේ වෙතට හැරවීමේ ඒකම බලාපොරොත්තුව

ඩෙල් ෆෙසෙන්ෆෙල්ඩ් විසිනි

ඇමරිකාව ඇගේ සම්පත් හෝ උපක්‍රම වලින්වත්, ඔවුන්ගේ උතුම් සිහිබුද්ධියෙන්වත්. ඔවුන්ගේ දැඩි අධිෂ්ඨාන ශක්තියේ ක්‍රියාකාරීමෙන්වත් බලවත් වූයේ නැත. දෙවියන් වහන්සේ ඇමරිකාව බලවත් කළනිසා එය බලවත් රාජ්‍යයක් බවට පත් විය. ධර්මිෂ්ඨ ජාතිය ඔසවනු ලබන බවත්, ස්වකීය දෙවියන්කොට ස්වාමීන් වහන්සේ ඇතිව සිටින ජාතිය ආශිර්වාද ලද්දන් බවත් දේව වචනයේ පවසා ඇත. (හිතෝපදේශ 14:3, ගීතාවලිය 33:12) 1 සාමුවෙල් පොතේ දෙවියන් වහන්සේ මෙසේ සඳහන් කර තිබෙන සේක. **"..... මක්නිසාද මට ගෞරව කරන්නන්ට මමත් ගෞරව කරමි. මා සුළුකොට සිතන්නෝ නීචකොට සලකනු ලබති."** (සාමුවෙල් 2:30)

දෙවියන් වහන්සේ ඇමරිකාවට ගෞරවකර තිබෙන සේක. මක්නිසාද ඇමරිකාව දෙවියන් වහන්සේට ගෞරව කරමින් උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමේ ස්වභාවය පවත්වාගෙන ගියෝය. මේ ජාතිය සර්වබලධාරී දෙවියන් වහන්සේ මත රැඳී සිටීමෙන් ව්‍යාජ දේවලට ඈත්ව යාම හඳුනාගත හැකිය. ඇත්තටම ඇමරිකාවේ බොහෝ නිර්මාතෘ ආදි පියවරු නැතිවී සිටියා වූ පව්කරුවන් ලෙස ජීවමාන දෙවියන් වහන්සේට සහ උන්වහන්සේගේ වචනයට බොහෝ සෙයින් ගෞරව කරනු ලැබුවෝය. වර්තමාන සභාව තුළ බොහෝ දෙනා නාමික ඇදහිලිවතුන්ව සිටින්නෝය. දෙවියන් වහන්සේගේ උපකාරය නැතුව සාර්ථකත්වය ලබාගත නොහැකිබව ඔවුන් දැන සිටින්නෝය.

මේ පරම්පරාව තුළඅපි වඩා හොඳ උපක්‍රම සමඟ කටයුතු කිරීමට වැඩි කැමැත්තකින් යුතුව අවධානය යොමු කර තිබෙන නිසා අපගේ දවස්වලදී ව්‍යාකූල ප්‍රශ්න හටගෙන ඇත. නමුත් දෙවියන් වහන්සේ තවමත් වඩා හොඳ අයුරකින් කටයුතු කරන මනුෂ්‍යයන්ව සොයමින් සිටින සේක. අතීතයේ සිටි අපේ පියවරු සෑම දෙයක්ම අවදානමට ලක්ව තිබියදීත් දෙවියන් වහ්සේව විශ්වාස කළෝය. නිදහස උදෙසා පොරබැදීම බොහෝ මනුෂ්‍යයන් අත්හැර දමා තිබේ. ඔවුන් උසස් අධ්‍යාපනයක් ලැබූ සහ සමකාලීන අයට ගෞරව කරනු ලැබුවෝය. ඒ නිසා ඔවුන්ගේ හදවත් පොදු ඒකඟතාවයක පවතින්නේය. ඔවුන්ගේසශ්‍රීකත්වය, ඔවුන්ගේ ශුද්ධ වූ ගෞරවය අවදානමට ලක්කර ගනිමින් අපි ඇමරිකානුවන් කියන නිදහස අත්හදා බැලීම්වලට යොමු වූයේය.

මේ අය කොපමණ මිලයක් ගෙවීමට සිදු වී තිබුණත් ඔවුන් විශ්වාස කළ දේ මත දැඩිව රැඳී සිටින්නෝය. ඔවුන් චරිතවත් මනුෂ්‍යයන් වූ අතර දුෂ්කරතාවයන් සහ අප්‍රසන්න තත්ත්වයන්ට මුහුණදීම තුළ ප්‍රතික්ෂේප කරනු ලැබීමට අත්හැරදමනු ලැබුවෝය. ඔවුන් නිර්මාණශීලී, ප්‍රඥාව ඇති මනුෂ්‍යයන් විය. උදාහරණ වශයෙන් ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී පදනම පසුගිය එකින් එක පරම්පාරාවේ අභිමතය වෙනස් කළේ නැත. දෙවියන් වහන්සේ සහ උන්වහන්සේගේ සදාකාල වචනය මත සිටිනවා වෙනුවට වෙනස් නොවන ලෙස ජනරජයක් පිහිටුවා ගත්තෝය.

ඔවුන් කැපවුණා වූ මනුෂ්‍යයන් විය. ඔවුන් දෙවියන් වහන්සේට කැපවුණා වූ මනුෂ්‍යයන් විය. දෙවියන් වන්සේගේ ආධිපත්‍යයට සහ උන්වහන්සේගේ වචනයේ මූලධර්මවල පදනමට කැපවුණා වූ මනුෂ්‍යයන් විය. ඔවුන් සදාචාරාත්මක නීති පැනවීමට අදිමදි කළේ (පැකිළුනේ) නැත. අපගේ ඉතිහාසයේ පළමු අවුරුදු එකසිය හැට තුළ අපගේ නීති බොහෝමයක් (උදාහරණ වශයෙන් ඉරිදා දිනවල ක්‍රීඩා සහ වෙනත් ව්‍යාපාර කටයුතු තහනම් කරන නීතිය, දේපළ නීතිය, දික්කසාද නීතිය, අපරාධ නීතිය) දෙවියන් වහන්සේගේ වචනයේ නීතීන් මත පදනම්වී තිබුණි.

ඒ මනුෂ්‍යයන් විශ්වාසවන්ත, චරිතවත්, නිර්මාණශීලී ප්‍රඥාවෙන් යුක්ත කැපවුණා වූ සහ ඔබගේත්, මගේත් නිදහසේ ප්‍රීතිය උදෙසා ඔවුන් තමන්ගේම ලේ වගුරුවනු ලැබූ අය විය. මක්නිසාද ඔවුන් දෙවියන් වහන්සේට ගෞරව කළ නිසා දෙවියන් වහන්සේත් ඔවුන්ට ගෞරව කළ සේක. අදටත් අපි ඒ ආශිර්වාද භුක්ති විඳින්නෙමු.

අවුරුදු දෙසීයයක් තුළ දෙවියන් වහන්සේ ඇමරිකාව ලෝකයේ සෑම අංශයකින්ම පාහේ එනම්, තාක්ෂණයෙන්, කර්මාන්තවලින්, වෛද්‍ය විද්‍යාවෙන්, කෘෂිකර්මාන්තයෙන්, අභ්‍යවකාශය තරණය කිරීමෙන්, ව්‍යාපාරවලින්, විද්‍යාවෙන්, විද්‍යුත් නිපැයුම් වලින් සහ සන්නිවේදන උපාංග වලින් නායකත්වයට ඔසවනු ලැබූ සේක. ඔබ මොහොතක් නතරවී සිතන විට එය නැබවින්ම අද්විතීය කාරණයකි. එය ස්වර්ගීය උපකාරයෙන්තොරව කිසිදාක ළඟාකරගත නොහැකිය.

## අනතුරු ඇඟවීමට හේතුව

අපි නැවත අතීත ආශිර්වාද වල තේජස දෙසට හැරී බලද්දී අපට මහත් අනතුරු ඇඟවීමක් දී තිබේ. අපි පසුතැවිලි වී හැරෙන්නේ නැති නම් තමන් වහන්ස්ගේ වචනයේ සත්‍යතාවය ලෙස ආශිර්වාද කළ දෙවියන් වහන්සේම උන්වහන්සේගේවචනයේ සත්‍යතාවය තුළ ඇමරිකාව විනිශ්චය කරනු ලබන සේක. ඇමරිකාව තමන්ගේ උරුමය වෙනුවෙන් මොර ගසා අඬමින් දෙවියන් වහන්ස... , ඔබ වහන්සේ නැතිව අපට ඉදිරියට යන්න බැහැ කියා පැවසිය යුතුය. ඒ අතරම අපි පසුගිය දශක කිහිපයක් දෙවියන් වහන්සේ නැතිව ඉදීයට යාමට උත්සාහ කර ඇත. අපි සුළඟ වපුරා සුළි සුළඟ නෙලාගෙන ඇත්තෙමු. 1960 ගණන්වලදී අපි විවෘතව නින්දිත සහ පාපිෂ්ඨ දේවලට ඉඩ හැරීමට පටන් ගත්තෙමු. 1970 ගණන්වල දී සමාවදීම නීත්‍යානුකූල කිරීමමත්, අපි දැනටමත් පිළිගෙන ඇති දේ අනුමත කිරීමටත් ආරම්භ කළෙමු. 1980 ගණන්වල දී දෙවියන් වහන්සේගේ වචනයේ නීති වලට සහ සදාචාරයට පටහැනි නීති සම්පාදනය කිරීමට ආරම්භ කළෙමු.

ජාතියක් ලෙස අපි ප්‍රචණ්ඩ ලෙස ක්‍රියා කිරීමෙන් ස්වර්ගීය සර්වබලධාරී දෙවියන් වහන්සේව උදහස් කරනු ලැබුවෝය. දෙවියන් වහන්සේගේ මුහුණට විරුද්ධව තමන්ගේ අත ඔසවා ක්‍රියා කිරීමට සහ උන්වහන්සේ වෙතින් ඈත්වයාමට ඇමරිකාවේ විශාලත්වය ප්‍රමාණවත් නැත.

## පසුතැවිලි නොවන්නේ නම් විනිශ්චය පැමිණේ

දෙවියන් වහන්සේ අපව විනිශ්චය කිරීම ප්‍රශ්නයක් නොවේද ... ? අපි පසුතැවිලි නොවන්නේ නම් දෙවියන් වහන්සේගේ විනිශ්චය කොයිතරම් දුරට ගමන් කරයිද ..... ? යන්න ප්‍රශ්නයක් වේ. දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාව ප්‍රතිෂේප කරන්නා වූ සියලු ජාතීන් දෙවියන් වහන්සේගේ සෙලවීම කරුණුකොටගෙන විනාශ වන්නෝය. **"දුෂ්ඨයෝ, එසේය. දෙවියන් වහන්සේ නිහි නැති කරන සියලු ජාතීහු පෙයොලට හැරියන්නාහුය."** (ගීතාවලිය 9:17) **"ධර්මිෂ්ඨකම ජාතියක් උසස් කරයි. එහෙත් කවර සෙනඟකට වුවත් පාපය නින්දාවක්ය".** (හිතෝපදේශ 14-34) හොෂෙයා අනාගතවකතෘ තුලින් දෙවියන් වහන්සේ මෙසේ පැවූසුසේක. **"මාගේ සෙනඟ දැනගැන්ම නැති කමින් නාස්ති වී සිටිති. නුඹ දැනගැන්ම එපා කළ නිසා මට පූජකකම් කිරීමෙන් මමත් නුඹ එපා කරන්නෙමි. නුඹ නුඹේ දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාව මතක නැති කළ නිසා මමත් නුඹේ දරුවන් මතකනැති කරන්නෙමි. "** (හොෂෙයා 4:6) **"ඔවුන් දඬුවම්විඳ මගේ මුහුණ සොයන තුරු මම මාගේ ස්ථානයට හැරී යන්නෙමි. ඔවුන්ට විපත පැමිණෙන විට ඔවුන් ඕනෑකමින් මා වෙතට එනවා ඇත. "** (හොෂෙයා 5:15)

ඇමරිකාව සියදිවි නසා ගැනීමේ මාර්ගයක ගමන් කරයි. විනාශය සහ විනිශ්චය නිසා බයිබලයේ සඳහන් වන දෙවියන් වහන්සේව අමතර කර සහ උන්වහන්සේගේ නියෝග අතහැර දමා ඇත. අපේ පියවරු නිශ්ඵල ලෙස ජීවිත පූජා කළාද ... ? දෙවියන් වහන්සේව ප්‍රතික්ෂේප කළා වූ පසුගිය ශිෂ්ඨාචාරයන් මෙන් මෙයත් සොහොන් පිටියෙන් අවසන් වන්නා වූ නිදහස පිළිබඳව උතුම් අත්හදා බැලීමක්ද ?

එඩ්මන් බෘක් මෙසේ කීවේය. නපුර ජය ගැනීමට අවශ්‍ය වන්නේ එකම දෙයයි. එනම් යහපත් මනුෂ්‍යයන් කිසිවක් නොකර සිටීමයි. නිශ්චිතවම අපි බොහෝ දෙනෙක් කර තිබෙන්නේ එයයි. ඇත්තටම කිසිවක් නොකර සිටනවාද .. අපි මුදල් ඉපැයීමට රූපවාහිනී නැරඹීමට , අපගේම කාර්යයන්වල යෙදීමට සහ ජාතිය මුදා ගැනීමට අනිත් අයට පන්දුව පාස් කිරීමේ කාර්යය වෙනුවෙන් කාර්ය බහුලව සිටින්නෙමු.

2 පිටුවට

"මාගේ කොටස නම් ස්වාමීන් වහන්සේ යැයි මගේ ආත්මය කියයි. එබැවින් උන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වන්නෙමි" (විලාප ගී 3:24)

1 පිටුවෙන්

# ඇමරිකාව නැවත දෙවියන්...

ඔබ සහ මම ජීවත් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයක් වන මනුෂ්‍යයන් කරුණුකොටදෙන මනුෂ්‍යයන් උදෙසා මනුෂ්‍යයන්ගේ පාලන තන්ත්‍රයක් ඇති රාජ්‍යයකයි. එයින් අපි අවසාන තීරණගන්නා වූ, දෙවියන් වහන්සේ ඉදිරියේ සිටින්නා වූ සහ මේ ජාතිය සිටින්නා වූ ස්ථානය වෙනුවෙන් අවසාන වගකීම් දරන්නාවූ අය වන්නෙමු. ප්‍රමාදවීම ඉක්මවා යාමට පෙර අපි මේ ජාතිය නැවත ගොඩනැගිය යුතුය.

## එකම බලාපොරොත්තුව

ජාතිය සදාචාරාත්මක දූෂිත වී, ආත්මිකාව අන්ධවී මානවාදය තුළ ආසාධාරණය ඉහළයන විට තමාගේ සුභසිද්ධිය සෙවීම ඉහළ යන විට භෞතික දේවලට ඇළුම්වන විට එවැනි නපුරෙන් ජය ගැනීමට හැකි මුළු විශ්වය තුළම ඇති එකම බලයක් පමණක් පවතිනවා. දකිනවිට එය ජීවමාන දෙවියන් වහන්සේගේ බලය බව අවබෝධ කරගත යුතුය. දෙවියන් වහන්සේම අප වෙතට පැමිණීම අපට අවශ්‍යව තිබේ. එමෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීමත්, දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය අපව බැහැ දැකීම ප්‍රකාශවීමත් අවශ්‍යව තිබේ. එය මාගේ මිතුරන්ට පිඹීදීම ලෙස පවතින්නේය.

බලාපොරොත්තු බිඳ වැටුණාවූ අවස්ථාවලදී දෙවියන් වහන්සේගේ පුද්ගලික මැදිහත්වීම සහ ඉතිහාසයේ සිදුවුණාක් මෙන් සෑමවිටම පිඹීදීම අයැද සිටීම අවශ්‍යව තිබේ. එකම බලාපොරොත්තුව දෙවියන් වහන්සේ උසස් කරනු ලැබීම සහ දෙවියන් වහන්සේ නැවත වාරයක් උන්වහන්සේ ස්වාමීන් වහන්සේ ලෙස මේ ජාතිය ඔසවා තැබීමත්, නිදහස් මනුෂ්‍යයන් ලෙස එකම බලාපොරොත්තුව උදෙසා ඔරොත්තුදී සිටීමත්‍ය. අපගේ දරුවන් සහ මුණුපුරන් උදෙසා එකම බලාපොරොත්තුව අතීතයේ දී මෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ පිඹීදීමේ බලය ලබා දෙමින් පාපය මකා දමා දෙවියන් වහ්සේගේ වචනයේ බලවත්කමින් සහ දෙවියන් වහන්සේ මූලධර්මවල පදනම මත නැවත ගොඩනගා බලවත් කරන සේක්වා යනුය.

මේ ජාතියට නැවත දෙවියන් වහන්සේ වෙතට හැරීඒම අප සියලුදෙනාටම ක්‍රිස්තුස් වහන්සේගේ නාමයේ අයිතිය ලබාගෙන දෙවියන් වහන්සේ වෙතට හැරීමඑ්ම එකම බලාපොරොත්තුවයි. ශාපයට සැබෑ හේතුව කුමක්දැයි ජාතියට තහවුරු කිරීම උදෙසා සුවය ගෙන එන සේක. සොදොම, ගොමෝරාවේ මනුෂ්‍යයන් දස දෙනෙක් දෙවියන් වහන්සේට සොයා ගැනීමට පුළුවන් නම් උන්වහන්සේ සොදොම ගොමෝරාව ආරක්ෂා කරන බව පැවසූ සේක. උන්වහන්සේට එසේ සොයා ගැනීමට පුළුවන් වූයේ නැත. 2 ලේකම් 7:14 වන පදයේ දෙවියන් වහන්සේ මෙසේ පවසන සේක. **"මාගේ නාමය දරන මාගේ සෙනඟ යටත් වී යාච්ඤා කර මාගේ මුහුණ සොයා තමුන්ගේ නපුරු මාර්ග අත්හැරියොත් මම ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව් කමාකොට ඔවුන්ගේ දේශය සුවකරන්නෙමි."** ( 2 ලේකම් 7:14)

අද ඇමරිකාව විනිශ්චය කරනු ලබන්නේ නැති වූ අයගේ (ගැලවීම නොලැබූ අයගේ) දුෂ්ඨකම නිසා නොව සභාවේ පසුබෑම නිසාය. ඇත්ත වශයෙන්ම අපගේ ජාතියේ පාපය යනු දේවස්ථානයේ පාපය විශාල ලෙස පරාවර්තනය වී පිළිබිඹුවීමට වඩා වැඩි දෙයක් නොවේ. අප හා එක්ව යාච්ඤා කරන්නේ නැහැ කියා හෝ පාසලේ දී බයිබලය කියවන්නේ නැහැ කියා අපි අපේ දරුවන්ට විරුද්ධව පැමිණිලි කරන්නෙමු. නමුත් අපගෙන් බොහෝ දෙනා ස්ථිරව බයිබලය කියවනවා සහ අපගේ දරුවන් සමඟ අපගේ නිවෙස්වලදී යාච්ඤා කිරීමෙහි නිදහසේ ක්‍රියා කරනවාද ... ? කියා මම පුදුමයට පත්ව සිටිමි.

අපි පරාජයවීම කරුණුකොටගෙනඅපගේ ජාතිය පුදුම සහගත ලෙස ඌණතාවයන්ට පත්ව සිටිති. එම නිසා කතුණුවන් වන අප අතරේ කී දෙනෙක් ආර්ථිකව නිදහසේ සිටිනාදැයි මම පුදුමයට පත්ව සිටිමි. සදාචාරය විකෘතිවීම, වෛශ්‍යාකම, රූපවාහිනී, චිත්‍රපට, පොත්පත් මත උදම් ඇනීමේ තත්ත්වයක් පැවතීම නිසා දැඩි පීඩාවට ලක්වී ඇත. නමුත් අපෙන් කොපමණ දෙනෙක් තමන්ගේ සදාචාරය පිරිසිදුව තබා ගැනීමට තමන්ගේ සිතුවිලි, වචන, පුරුදු සහ ජීවන රටාව පිරිසිදුව තබාගන්නවාදැයි මම පුදුමයට පත්ව සිටිමි. අපගේ දවස්වලදී සභාව දෙවියන් වහන්සේගේ වචනයට ඇහුම්කන්දීම ප්‍රතික්ෂේප කර සහ උන්වහන්සේගේ අනාගතවක්තෘවරුන් පාපයට විරුද්ධව මොරගසා කියූ දේවල් ප්‍රතික්ෂේප කර තිබේ. දර්ශනවාදය අපගේ ජීවිතවලට තෝරා ගැනීමට ඉඩ හැරීම තුළ සභාව සැප පහසු වෙන් සිටීමට යොමු වී ඇත. ඒ අතරම වෛශ්‍යාකම තුළ ජීවත්වීම නිසා භෞතිකවාදීව සහ නිවස තුළ ආත්මාර්ථකාමීව සිටීමට යොමු වී ඇත.

එසේ වුවත් අපි නිහ්චිතවම පව්කරුවන්ට ප්‍රේම කරන්නනෙමු. ශුද්ධාත්මයාණන් වහන්සේගේ පිඹීදීම හේතුවෙන් ශුද්ධ වූ ජීවිතයක් ගතකිරීම අපට අවශ්‍යව තිබේ. සභාවෙන් පිටත සිටින්නා වූ සෑම අවස්ථාවකම පසුතැවිලි නොවන්නා වූ ඇදහිලිවනතුව ඒ අවාසනාවන්ත තත්ත්වයෙන් මුදා ගැනීමට බලයෙන්පූර්ණව දේශනා කිරීම අපට අවශ්‍යව තිබේ.

පිඹීදීම යනු ආත්මික පරිහානිය මැඩලීමට සහ ආත්මික ජවය ඇති කිරීමට දිව්‍යමය උපාය මාර්ගයකි. වෙන කිසිවක් නැත. එයට වඩා අඩුවෙන් කළයුතු දෙයක් ද නැත.අප එකට එකතු වී උපරිම උත්සහය දැරීමෙන් ප්‍රයෝජනයක් නොවීය. දෙවියන් වහන්සේ ඇත්තටම සොයන්නේ සම්පූර්ණයෙන්ම උන්වහන්සේගේ සෙනඟව සිටින මනුෂ්‍යයන්ව වන අතර ඔවුන් තුළින් උන්වහන්සේගේ බලය සහ ශක්තිමත් බව ප්‍රකාශ කිරීමට හැකි වේ.

## වෙනසක් ඇති කිරීමට ධෛර්‍යමත් වෙන්න.

ආහබ් රජුගේ කාලයේ ඊශ්‍රායෙල් ඉතිහාසය අඳුරුව තිබුණි. එළියා අනාගතවක්තෘ දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයාව සිටිමින් උන්වහන්සේගේ භාජනය වී ඊශ්‍රායෙල් ජාතියේ හදවත් උන්වහන්සේ වෙතට හරවනු ලැබීය. එළියා අනාගතවක්තෘ ස්වර්ගයෙන්ගින්දර ගෙනඒමට මොර ගැසීමට ප්‍රථමයෙන් තමාගේ ජීවිතය ආරක්ෂා කර ගැනීම පිණිස සැනැඟවී සිටින්නැයි දෙවියන් වහන්සේ ඔහුට පැවසූ සේක. අවුරුදු තුනක් යාච්ඤාවෙහි යෙදී සිටීමට, හුදකලාවේ සිටීමට, ඇදහිල්ලෙහි සිටීමට පසුව දෙවියන් වහන්සේ ඔහුට නැවත කථාකළ සේක. ගොස් රජුට පෙනී සිටින්නැයි දෙවියන් වහන්සේ කී සේක. මනුෂ්‍යයන් අතරෙන් ස්වල්ප දෙනෙක් පමණක් දෙවියන් වහන්සේගේ බලය ඔවුන්ගේ ජීවිතවලට ලැබෙන තෙක් උන්වහන්සේ මත රැඳී සිටින්නෝය. එම බලය ලැබූ පසු ඔවුන් පිටතට පැමිණ යාච්ඤා කරමින් ස්වර්ගයෙන් ගින්න ගෙන්වාගෙන තම ජාතියේ සෙනඟ දෙවියන් වහන්සේ වෙතට නැවත හරවනු ලබන්නෝය.

එළියා අනාගතවක්තෘ අසාමාන්‍ය මනුෂයෙක් යැයි ඔබ පැවසිය හැකිය. ශුද්ධ ලියවිල්ලේ පවසන්නේ එය නොවේ. ශුද්ධ ලියවිල්ලේ පවසන්නේ එළියා අපට වඩා දැඩි උද්යෝගයක් තිබූ සහ අනිත් ඕනෑම මනුෂ්‍යයෙකුට වඩා වෙනස් ආකාරයක කෙනෙක්ව සිටියේ නැති බවයි. (යාකොබ් 5:17) එළියාගේ දෙවියන් වහන්සේ කොහෙද .... ? උන්වහන්සේ ගින්න එවන්නේ නැත්තේ ඇයි .... ? පිඹීදීම එවන්නේ නැත්තේ ඇයි ... ? කියා ඔබ ඇසිය හැකිය. සැබෑ ප්‍රශ්නය නම්, එළියාගේ ස්වාමීවූ දෙවියන් වහන්සේ කොහෙද .. ? මේ පරම්පරාව තුළ මනුෂයන් වෙනස් දෙයක් නිර්මාණය කිරීමට ධෛර්යමත්ව නොසිටින්නේ ඇයි ... ? යන්නයි.

එක් ව්‍යාපාරික මනුෂ්‍යයෙක් කරුණු කොටගෙන ඇමරිකා එක්සත් ජනපදයේ අවසාන මහත් වූ පිඹීදීම ආරම්භ විය. දහවල් කෑම පැයේ දී ඉහළ කාමරයක් තුළ ඔහු යාච්ඤා රැස්වීමක් පැවැත්වීමට ආරම්භ කළේය. ඒ කාලය අතරතුර දෙවියන් වහන්සේ ආර්ථික අර්බුදයක් ඇතිවීමට සලස්වා තිබූ බව සැලකිල්ලට ගත යුතුය. සෙනඟගේ හදවත් ස්වර්ගීය රැකවරණය වෙතට හරවනු ලැබුවෝය. වැඩි කාලයක් ගතවෙන්නට ප්‍රථම දිවා ආහාර වේලාවට ලැබෙන විවේකයේ දී දසදහස් ගණන් දෙනා යාච්ඤා කිරීමට එකතු වූවෝය. වැඩ කරන්නාවූ කාලය තුළ දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය ඇමරිකා එක්සත් ජනපදය තුළ පැතිර යන්නට විය.

සාමාන්‍ය මනුෂ්‍යයෙක් අසාමාන්‍ය දෙවියන් වහන්සේට ක්‍රියා කරන්නට සැලැස්වීම කරණුකොටගෙන මුළු ජාතියම උන්වහන්සේ ඉදිරියේ දණින් වැටීමට රැගෙන ආවෝය. උන්වහන්සේ අතීතයේ දී කළා වූ දේ මගේ මුළු හදවතින් විශ්වාස කරන විට නැවතත් උන්වහන්සේ එය ඉටුකරන සේක. එලෙස උන්වහන්සේගේ අභිමුඛත්වයේ සිටින මනුෂ්‍යයෙක් උන්වහන්සේව දකින විට උන්වහන්සේ නැවත එය ඉටුකරන සේක. අපි අපගේ ජීවිත මේ උදෙසා නිරතුරුවම ධෛර්‍යමත්ව තබා ගනිමින් මිලය ගෙවන්නේ නම්, උන්වහන්සේ කාරණාවන් ඉටුකරන බව අපි දකින්නෙමු.

# ඵලදායී යාච්ඤාව

ඈන් ග්‍රැහැම් ලෝට්ස් විසින

පියාණෙනි, අපගේ හදවත්වලින් දැන් ඔබගේ අභිමුඛත්වය ඉදිරියෙහි වැඳ වැටී සිටින්නෙමු. අපි ඔබවහන්සේගේ මුහුණ සොයමින් යාච්ඤා කරන්නෙමු. අපි අපගේ ජීවිත යටහත් කරමින් අපගේ පාපය ගැන පසුතැවිලි වන්නෙමු. ස්වාමී වූ දෙවියන් වහන්ස, අපි ඔබගේ ස්වර්ගීය ක්‍රියාව අරමුණු කරගන්නෙමු. ඔබ වහන්සේ අපට ඇහුම්කන් දෙන සේක්වායි අපි අයැද සිටින්නෙමු. ඔබවහන්සේ අපට සමාව දෙමින් අපගේ ජාතියට සුවය ගෙනනෙ පිණිස අපි කළ යුතු කුමක්ද ? ඒ උදෙසා අපව පාවිච්චි කළ මැනව. අපට ඔබවහන්සේගේ සමාදානය අවශ්‍යව තිබේ. මේ ගෘහය තුළ ඔබවහන්සේගේ අභිමුඛත්වය පැතිරීයාම අපට අවශ්‍යව තිබේ. මේ ශාලාව තුළින් අපගේ ජාතිය වෙත ඒ අභිමුඛත්වය ගලායන සේක්වා. ඔබවහන්සේගේ මහිමාන්විත නාමයෙන් අපි ඉල්ලා සිටින්නෙමු. ඔබගේ වචනයෙන් දැන් අපට කථා කිරීමට හැකිසේක්ද ..? යේසුස් වහන්සේගේ නාමයෙන් අපි මෙය ඉල්ලා සිටින්නෙමු. ආමේන්

අපගේ ජාතිය අර්බුද මැද සිටින්නෝය. අපගේ ජාතිය දෙවියන් වහන්සේගෙන් ඈත්ව සිටීමේ සාක්ෂි ලෙස ව්‍යාකූලත්වය සංකූලතාවය (පැටලිල්ල) කෝපය, දැඩි වෛරය (ද්වේශය) බෙදී සිටීම සහ පරස්පර මත දැරීම පවතින බව මම විශ්වාස කරමි. අපි දෙවියන් වහන්සේව අත්හැර දමනවා නම්, උන්වහන්සේත් අපව අතහැර දමන බවට උන්වහන්සේ නැවත, නැවත අපට අනතුරු අඟවන සේක. අපි ආත්මික නියඟය (ඉඩෝරය) සහිත කාලයක ලක්ෂණ ඇතිව සිටින බව මම විශ්වාස කරමි. අපි දෙවියන් වහන්සේගේ සෙනඟ නම් උන්වහන්සේගේ නාමය කරුණු කොටගෙන මොර ගැසීමට අපගේ ජීවිත යටහත් කරගනිමින් යාච්ඤා කර උන්වහන්සේගේ මුහුණ සොයා අපගේ නපුරු මාර්ග අත්හැර හැරී එමින් පිළියෙලවීම අවශ්‍යය එකම කාරණයයි. අපගේ ජාතිය නැවත හරි මාර්ගයට ගෙන ඒමට එය ප්‍රධාන කාර්යයයි.

දෙවියන් වහන්සේගේ සෙනඟගේ හදවත්වල මෙය ආරම්භ විය යුතු බව මම විශ්වාස කරමි. එවිට සැබවින්ම ඵලදායී යාච්ඥාවේ ක්‍රියාමාර්ගවල ලක්ෂණ අපගේ යාච්ඤා කිරීම තුළ

3 පිටුවට

2 පිටුවෙන්

# ඵලදායී යාච්ඤාව...

පෙනෙන්නට පටන් ගන්නේය. මම දුර්වල නිසා මගේ යාච්ඤා ජීවිතය මලානිකව තිබේ. නමුත් දෙවියන් වහන්සේ මෙපමණ දුරක් මාව උසුලාගෙන ආසේක. උන්වහන්සේ මට මහත් වූ කාරණා උගන්වා තිබෙන සේක. දානියෙල් ඔහුගේ ජාතිය උදෙසා යාච්ඤා කිරීමේ දී කළ යාච්ඤාවෙන් උන්වහන්සේ මට උගන්වා තිබෙන්නේ මොනවාද ... ? අපගේ ජාතිය උදෙසා යාච්ඤා කිරීමේ දී දානියෙල්ගේ යාච්ඤාවේ ආදර්ශය ඵලදායී ලෙස යාච්ඤා කිරීමට අපට උපයෝගී කරගත හැකි බව මම විශ්වාස කරමි.

## යාච්ඤා කිරීමට යොමු කරනු ලැබීම

දානියෙල් උපත ලැබුවේ සහ හැදී වැඩුණේ යෙරුසලමේය. ඔහු තරුණ වයසට පැමිණෙද්දීම දෙවියන් වහන්සේගේ අණකිරීම මත බබිලෝනිවරු යෙරුසලමට පැමිණියෝය. යුදා සෙනඟගේ කැරලි ගැසීම, රූප නමස්කාරය සහ දෙවියන් වහන්සේට අකීකරුවීම නිසා යුදා සෙනඟව විනිශ්චය කරන පිණිස දෙවියන් වහන්සේ නෙබුකද්නේශර් රජු සහ බැබිලෝනිවරුන්ව එවූ බව දෙවන රාජාවලියේ සඳහන් වේ. පළමුවන ප්‍රහාරයේ දී නෙබුකද්නේශර් තරුණයන් දෙසීයයක් බැබිලෝනියට රැගෙන ගියෝය. දැනියෙල් ද ඊට ඇතුළත් විය. වහල්කමට බැබිලෝනියට ගෙනයාමේ හැටහත්වන වර්ෂයේ දී දානියෙල් මෙම යාච්ඤාව කළේය. දැනියෙල් 9 වන පරිච්ඡේදය) යෙරමියාගේ පොත කියවීම නිසා ඔහු යාච්ඤා කිරීමට පටන් ගත්තේය. අවුරුදු හැත්තෑවකට පසුව **වහල්කමින් නැවත ගෙන එන බව දෙවියන් වහන්සේ පවසා තිබූ බව මම අනාවරණය කරන්නෙමි. "මක්නිසාද ස්වාමීන් වහන්සේ මෙසේ කියන සේක. බැබිලෝනියේ අවුරුදු හැත්තෑවක් සම්පූර්ණ වූ කල්හි මම නුඹලා දෙස බලා නැවත මේ ස්ථානයට නුඹලා පැමිණවීමෙන් නුඹලා ගැන මාගේ යහපත් වචනය ඉෂ්ඨකරන්නෙමි. මා විසින් නුඹලා ගැන කරන යෝජනා මම දනිමි. නුඹලාට මතු කාලයේ දී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනායයි ස්වාමීන් වහන්සේ කියන සේක. නුඹලා මට අඬගසන්නහුය ගොස් මට යාච්ඤා කරන්නහුය. මම ද නුඹලාට ඇහුම්කන් දෙන්නෙමි. නුඹලා මා සොයනවා ඇත. නුඹලාගේ මුළු සිතින් මා සොයන කළ මා නුඹලාට සම්බ වෙනවා ඇත."** (යෙරමියා 29:10-13) දානියෙල් මෙම වචනය කියවද්දී අවුරුදු හැත්තෑවකදී දෙනු ලබන දෙවියන් වහන්සේගේ පොරොන්දුව දුටුවේය. ඊට තව ඇත්තේ අවුරුදු තුනක් පමණක් බව ඔහු සිතුවේය. නමුත් අපි දෙවියන් වහන්සේව සෙවීමට නම් තමන්ගේ මුළු හදවතින් දෙවියන් වහන්සේව සෙවිය යුතුය.

එබැවින් යාච්ඤාවෙන් දානියෙල් එලෙස යාච්ඤා කළේය. එය ක්ෂණික හැඟීමක් නොවේ. එය මාංශයට අදාළ කාරණයක් නොවේ. නමුත් බිඳුණා වූ හදවතක කාරණයකි. ඩේවිඩ් විල්ක්‍රසන් හෞතිස්ම වූ විට සිතේ දැඩි වේදනාවෙන් මෙසේ කවේය. යාච්ඤා කිරීමට ඔහුව යොමු කරනු ලැබීය. මක්නිසාද දෙවියන් වහන්සේගේ වචනය තුළ ඇති උන්වහන්සේගේ පොරොන්දුව කියෙව්වේය. එමෙන්ම ඔහුගේ ලෝකය තුළ ඇති ප්‍රශ්න ඔහු දැක තිබුණේය. ඔහුගේ ජාතිය දෙවියන් වහන්සේගෙන් වෙන්ව තිබුණේය. දානියෙල්ව වහල්කමට ගෙනයාමෙන් අවුරුදු විස්සකට පසුව නෙබුකද්නේශර් තුන්වෙනි වර යුදා දේශයට පහර දුන්නේය. නෙබුකද්නේශර් නුවර පවුර බිඳ දැම්මේය. දේව මාළිගාව විනාශකර දැම්මේය. නගරය ගින්නෙන් දවා දැම්මේය. මනුෂ්‍යයන්ව වහල්කමට ගෙන නොගොස් පාරවල් දිගේ කුරිරු ලෙස මරා දැම්මේය. යෙරුසලම සහ දේව මාළිගාව තවත් ඉතරු නොවීය. එබැවින් දානියෙල් ඔහුව වහල්කමට රැගෙන යාමෙන් අවුරුදු හැටහතකට පසුව ඔහුගේ නගරය සහ ජනතාව ගැන බිඳුණාවූ හදවතක් ඇතිව සිතේ වේදනාවෙන් මෙලෙස පැවසුවේය. දෙවියන් වහන්ස, අවුරුදු හැත්තෑවකින් පසුව අපව නිදහස් කරන බව ඔබවහන්සේ පොරොන්දු වූ සේක. දේවමාළිගාව නැවත ගොඩනගන පිණිස නැවත අපව යෙරුසලමට යැවුව මැනව. දානියෙල් ඔහුගේ ලෝකය තුළ ඔහු දුටුවා වූ ප්‍රශ්න දෙවියන් වහ්සේගේ පොරොන්දුව සමඟ සම්බන්ධ කළේය.

ඵලදායී යාච්ඤාවකින් එය ආරම්භ වන බව මම සිතමි. බලපෑමක් සමඟ එය ආරම්භ වේ. අපගේ ලෝකයේ ප්‍රශ්න ගැන සෝදිසියෙන් සිටිමු. කෝපය, බෙදීම, විභාග නොකර විනිශ්චය කිරීම, තණ්හාව, තවත් බොහෝ දේ ගැන සෝදිසියෙන් සිට දෙවියන් වහන්සේගේ පොරොන්දුව සමඟ ගලපා ගනිමු. අපි නිතර දකින බොහෝ පොරොන්දු අපට තිබේ. **"මාගේ නාමය දරණ මාගේ සෙනඟ යටත් වී, යාච්ඤා කර, මාගේ මුහුණ සොයා තමුන්ගේ නපුරු මාර්ග අත්හැරියොත් මම ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව් සමාකොට ඔවුන්ගේ දේශය සුවකරන්නෙමි."** (2 ලේකම් 7:14) ඔබ දන්නවා අපි අපේ ඇඟිල්ල ඔවුන් දෙසට දිගු කරන බව එය හරිද ... ? එය කිරීම පහසුව තිබේ. නමුත් දෙවියන් වහන්සේ ඔබත් මමත් දෙස බලා සිටිනසේක. අපි අපේ නපුරු මාර්ග අතහැර ඒවා නතරකර දමා පසුතැවිලි වී හැරී එන්නේ නම් උන්වහන්සේ මෙසේ පවසනසේක. **"මම ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව් සමාකොට ඔවුන්ගේ දේශය සුව කරන්නෙමි."** ඒ නිසා දානියෙල් දෙවියන් වහන්සේගේ වචනය මත රැඳී සිටියේය.

ඔබට අවශ්‍යව තිබෙන දේ සහ යාච්ඤාව අතර වෙනසක් ඇත. ඔබ බලාපොරොත්තු වන්නේ මොනවාද ... ? ඔබ සිතන්නේ මොනවාද .. ? දෙවියන් වහන්සේගේ වචනයේ උන්වහන්සේගේ පොරොන්දුවේ සඳහන් ආකාරයට ඔබ යාච්ඤා කරනවාද ... ? ඔබගේ සෙනඟ තමුන්ගේ ජීවිත යටත් කර, යාච්ඤා කරමින් තමුන්ගේ නපුරු මාර්ග අත්හැර උන්වහන්සේගේ මුහුණ සොයන විට,අපි උන්වහන්සේ වෙතට හැරී ඇවිත් උන්වහන්සේ මත රැඳී සිටිය යුතු බව කී සේක. එය උන්වහන්සේට අපක්ෂපාතිවීම නොවේ. උන්වහන්සේගේ වචනය මත රැඳී සිටින විට උන්වහන්සේ ප්‍රේම කරන සේක. අපගේ ලෝකය තුළ ඇති ප්‍රශ්න දෙස අපි බලමු. අපි පොරොන්දුව තදින් අල්ලාගෙන උන්වහ්සේ වෙතට හැරී යාච්ඤා කරමු. ඵලදායී ලෙස යාච්ඤා කිරීමට පළමුවෙනි යතුර බලපෑමකින් යුතුව යාච්ඤා කිරීමට යොමු කරනු ලැබීමයි.

## යාච්ඤා කිරීම තුළ කේන්ද්‍රගතවීම

දෙවන ප්‍රධාන යතුර කේන්ද්‍රගතවීමයි. **"එවිට මම නිරාහාරව, ගෝණි රෙද්ද අළු ද ඇතිව යාච්ඤාවෙනුත්, කන්නලව්වෙනුත්, ස්වාමී වූ දෙවියන් වහන්සේ සොයන පිණිස මාගේ මුහුණ උන්වහන්සේ දෙසට හැරෙවා"** (දානියෙල් 9:3) එය යාච්ඤාවේදී දෙවියන් වහන්සේ තුළ කේන්ද්‍රගතවීමයි. එය ඔබගේ මාලිමාවේ ඊතලය නිතරම ඇදහිල්ලෙන් දෙවියන් වහන්සේ වෙතට යොමු කිරීම පිළියෙල කරගැනීමයි. නිරාහාරව සිටීම ආහාර නොමැතිව සිටීම පමණක් නොවන බව ඔබ දන්නේය. නිරාහාරව සිටීම, ඕනෑම දෙයක් නැතිව සිටීම, සියලුම දේවල් පැත්තකට දැමීම, සම්පූර්ණ අවධානය අපේ දෙවියන් වහන්සේවෙතට යොමු කිරීම වේ. ඵලදායීව යාච්ඤා කිරීමට අපගේ කාලය සැලසුම් කිරීම් පසෙක දමා ගෝණි රෙදිද අළුද ඇතිව අපගේ මුළු අවධානය දෙවියන් වහන්සේ වෙතට යොමු කරමු. එය යටහත්කමයි. දෙවියන් වහන්ස .... අපට ඔබවහන්සේව අවශ්‍යයි. ඔබවහන්සේ අපට උපකාර නොකරන සේක් නම් අපට වෙන උපකාරයක් නොමැත. ඔබවහන්සේ ඔබගේ සෙනගගේ හදවත්වලට පිඹීදීම ගෙන එන්නේ නැති නම් අපට උද්යෝගිමත් විය නොහැකිය. එමෙන්ම එහිදී අපගේ ජාතියට සැබවින්ම බලාපොරොත්තුවක් නැත. අපි ඔබවහන්සේගේ විනිශ්චය යටතට පැමිණෙන්නේ නම් අපට ඔබවහන්සේව අවශ්‍යවන සේක.

දානියෙල්ගේ යාච්ඤාව කේන්ද්‍රගතවී තිබුණි. දානියෙල් උසස් සහ ආඩම්බර භාෂාවකින් (හඬකින්) යාච්ඤා කළේ නැත. ඔහුගේ වැදවැටීම තුළ යටහත්කම, අවංකකම, බලවත් ඕනෑකම සහ පුද්ගලිකත්වයෙන් යුතුව දෙවියන් වහන්සේව සෙව්වේය. ඔබගේ යාච්ඤාව කේන්ද්‍රගතවී තිබෙන්නේද ...? ඔබගේ ඇදහිල්ලේ ඉලක්ක ගතවීම දෙවියන් වහන්සේ වෙතට හැරීමට යොමු වී තිබෙනවාද ... ? දානියෙල්ගේ මෙම යාච්ඤාව තුළ දෙවියන් වහන්සේ සමඟ තනිව කාලය ගතකරමින් අයැද සිටියෝය. අපගේ මුහුණ, අපගේ මොරගැසීම උන්වහ්සේ වෙතට යොමු කරනවාද ... ? අවසාන වශයෙන් ඔබ එසේ කළේ කවදාද ... ? ඔබ නිරතුරුව එසේ කරනවාද ... ?

## දෙවියන් වහන්සේ සමඟ අපේ සම්බන්ධතාවය තුළ දැඩි විශ්වාසය

ඵලදායී යාච්ඤා කිරීමක තුන්වන යතුර නම්, දෙවියන් වහන්සේ සමඟ අපේ සම්බන්ධතාවය තුළ දැඩි විශ්වාසයයි. **"මාගේ දෙවි වූ ස්වාමීන් වහන්සේට යාච්ඤා කොට පව් කියා දෙමින් මෙසෙ කීමි. අහෝ ස්වාමීන්වහන්ස, ඔබට ප්‍රේමකොට ඔබගේ ආඥා රක්ෂාකරන්නන්ට ගිවිසුමත් කරුණාවත් පවත්වන්නා වූ මහත් වූ භයංකාර වූ දෙවියන් වහන්ස."** (දානියෙල් 9:4) දෙවියන් වහන්සේ සමඟ ගිවිසුමේ සම්බන්ධතාවයක් දානියෙල්ට තිබුණේය. යෙරුසලම තුළ වර්ධනයවුනාවූ තරුණ ළමයෙක් වශයෙන් දානියෙල් ගිවිසුමේ ආගමික පූජා පිළිවෙත් (උත්සව) පූජාවන්, තුළ ගොඩනැගුණේය. එමෙන්ම ඔහු දෙවියන් වහන්සේට අයිති බවත්, දෙවියන් වහන්සේ ඔහුට අයිති බවත් ඔහු දැන සිටියේය. අපි අලුත් ගිවිසුමට පැමිණෙන විට යේසුස් වහන්සේ කුරුසපත්වීමට ප්‍රථම උන්වහන්සේ පැමිණියේ අලුත් ගිවිසුමක් පිහිටුවීමට බව උන්වහන්සේ කී සේක. උන්වහන්සේ පැරණිගිවිසුම අවලංගු (අහෝසි) නොකළ අතර එය සම්පූර්ණ කළ සේක. එමෙන්ම අලුත් ගිවිසුම උන්වහන්සේගේ ලේ කරුණුකොටගෙන පිහිටුවීම සංඛේත කරන බව උන්වහන්සේ කී සේක.

පාස්කු මංගල්‍යයේ අදහස පිළිබඳව සැලකිල්ලට ගන්න. දෙවියන් වහන්සේ, මෝසෙස්ව පාරාවෝ වෙතට යවමින් ඊශ්‍රායෙල් සෙනඟව පිටත්කර හරින්නැයි කී සේක. පාරාවෝ දස වරක් එය ප්‍රතික්ෂේප කළේය. ඉන්පසු දෙවියන් වහන්සේගේ විනිශ්චය පැමිණෙන ලෙස උන්වහන්සේ මරණයේ දූතයාව එවා මිසරයේ සියලු කුළුදුලන් වන මුනුෂ්‍යයන්ගේත් සිව්පාවුන්ගේත් පළමු ඵලය හෙළාදමනු ලැබූ සේක. නමුත් දැඩි කෝපය (උදහස) තුළ දෙවියන් වහන්සේගේ දයාව උන්වහන්සේගේ සිත තුළ පැවතුණු සේක. උන්වහන්සේ ඊශ්‍රායෙල් සෙනඟට කථාකොට බැටළු පැටවකුගේ ලේ රැගෙන ඔවුන්ගේ නිවෙස්වල උළුවහු කණුවල ඒ ලේ ආලේප කර බැටළුපැටවාගේ ලේ යටතේ සිටින්නැයි කී සේක. එවිට ඔවුන්ව උන්වහන්සේගේ උදහසින් මුදාගනු ලැබූ සේක.

අලුත් ගිවිසුමේ දී යේසුස් වහන්සේ යොර්දාන් ගඟෙන් එහා පැත්තේ යනවා

4 පිටුවට

"මම ඔබට ස්තුති කරන්නෙමි. මක්නිසාද ඔබ මට උත්තර දී මාගේ ගැලවීම වී සිටින සේක" (ගීතාවලිය 118:21)

3 පිටුවෙන්

# ඵලදායී යාච්ඤාව...

යොහාන් බෞතිස්ත දුටු විට ඔහු මෙසේ කීවේය. **"අන්න ලෝකයේ පාපය දුරුකරන දෙවියන් වහන්සේගේ බැටළු පැටියාණෝ "** (යොහාන් 1:29) පසුව යේසුස් වහන්සේ කුරුසිය මත මරණයට පත්වන විට අපගේ පාපය උදෙසා පූජාවුනා වූ දෙවියන් වහන්සේගේ බැටළු පැටවා ලෙස උන්වහන්සේ මරණයට පත් වූ සේක. යේසුස් වහන්සේ අපගේ ගැලවුම්කරුවාණන් ලෙස අපි පිළිගන්නාවිට සහ අපගේ ඇදහිල්ල උන්වහ්නසේ මත තබන විට අපගේ හදවතේ උළුවහු කණුවේ බැටළු පැටවා වන උන්වහන්සේගේ ලේ ආලේප කර උන්වහන්සේගේ විනිශ්චයෙන් අපව මුදා ගන්නා සේක.

මම කුඩා ගැහැණු ළමයෙක්ව සිටියදී මම එය අත්දුටුවෙමි. උන්වහන්සේ මා උදෙසා මැරුණු බව මම දැනගත්තාම මම උන්වහන්සේගෙන් සමාව අයැද සිටිමින් මගේ හදවත තුළට පැමිණ මගේ ගැලවුම්කරුවාණන් වන ලෙස ඉල්ලා සිටියෙමි. මට බොහෝ දේ තේරුණේ නැතිවුනත් මම ඒ මොහොතේ දෙවියන් වහන්සේගේ දරුවෙක් බවට ත් වූ බව මම විශ්වාස කළෙමි. ඒ මොහොතේ මාගේ පාපයට සමාව දෙන ලෙස මම අයැද සිටි නිසා මම සදාකාලික ජීවිතයක් ලැබුයෙමි. ඒ වගේම ඒ මොහොතේ ස්වර්ගය මා වෙනුවෙන් විවර විය. නමුත් ඊට අමතරව සිදුවූයේ කුමක්දැයි ඔබ දන්නවා ද ... ? දෙවියන් වහන්සේ ගිවිසුමේ සම්බන්ධතාවයක් මා සමඟ ගොඩනැගූ සේක. ඒ නිසා මම දෙවියන් වහන්සේට අයිති වූවා පමණක් නොව දෙවියන් වහන්සේ මටත් අයිති විය. එමෙන්ම උන්වහන්සේගේ මතකයේ මාව තබාගන්නා සේක.

වෙනස් ආකාරයේ යාච්ඤා කිරීමක් පිළියෙළ කරගත යුත්තේ ඇයි කියා ඔබට පැවසීමට මට ඉඩදෙන්න. ඕනෑම කෙනෙකුට යාච්ඤා කිරමට හැකිය. දෙවියන් වහන්සේට අවශ්‍ය ඕනෑම කෙනෙකුගේ යාච්ඤා කිරීමට ඇහුම්කන්දීමට උන්වහන්සේට හැකිව සිටිනසේක. නමුත් ඔබ ක්‍රිස්තුස් යේසුස් වහ්නසේගේ ගිවිසුමේ සම්බන්ධතාවය තුළ උන්වහ්සේ වෙතට පැමිණෙන විට උන්වහන්සේ ඔබේ යාච්ඤාවට ඇහුම්කන් දී පිළිතුරු ලබාදෙන බව ඔබට සහතිකද .. ? ඒ නිසා යේසුස් වහන්සේ සමඟ ගිවිසුමේ සම්බන්ධතාවය ගොඩ නැගීමට ඔබ කටයුතු කරනවාදැයි ඔබෙන් ඇසීමට මට ඉඩ දෙන්න. ඔබ කුරුසිය වෙතට ගමන් කරන්නේ කෙසේද .. ? ඔබ ඔබගේ වරද ගැන පසුතැවිලි වෙමින් උන්වහන්සේගෙන් සමාව අයැද සිටිමින් ඔබගේ හදවතේ උළුවහු කණුවල ලේ ආලේප කරන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටිනවාද ...? ඔබ එසේ කරමින් ඔබව මුදාගත් නිසා උන්වහන්සේට ප්‍රශංසා කරනවාද ... ? යේසුස් වහන්සේ ඔබ වෙනුවෙන් විනිශ්චය විඳිමින් මරණයේ දූතයා ඔබව පසුකර යන්නට සලස්වා සදාකාලය වෙතට ඔබට ගමන් කරන්නට සහ අපගේ පියාණන් වහන්සේගේ ගෘහයට ගමන් කිරීමට සලස්වා ඇත. ඔබ පියාණන් වන්සේගේ දරුවෙකි. යේසුස් වහන්සේගේ ලේ කරුණුකොටගෙන වන්දිය ගෙවා මිලට ගෙන උන්වහන්සේ ඔබ සමඟ ගිවිසුමේ සම්බන්ධතාවය පවත්වන සේක. එම නිසා ඔබ ඔබගේ දෙවියන් වහන්සෙවන ස්වාමීන් වහන්සේ වෙතට හැරී උන්වහන්සේට යාච්ඤා කරනවාද ...? එයින් පිළියෙල වන වෙනස කුමක්ද ...?

## දෙවියන් වහන්සේගේ චරිතය තුළ දැඩි විශ්වාසය

දානියෙල් දෙවියන් වහන්සේ සමඟ ඇති ඔහුගේ ගිවිසුමේ සම්බන්ධතාවය තුළ පමණක් දැඩි විශ්වාසය ඇතිව සිටියා පමණක් නොව දෙවියන් වහන්සේගේ චරිතය තුළත් ඔහු දැඩි විශ්වාසය තැබුවෝය. **".... අහෝ ස්වාමීන් වහන්ස, ඔබට ප්‍රේමකොට ඔබගේ ආඥා රක්ෂා කරන්නන්ට ගිවිසුමත් කාරුනාවත් පවත්වන්නා වූ මහත් වූ භයංකාර වූ දෙවියන් වහන්ස .... "** (දානියෙල් 9:4) දානියෙල් දෙවියන් වහන්සේගේ විශ්වාසනවන්තකම දැඩි ලෙස විශ්වාස කළේය. රජතුමාගේ ආහාරපාන ප්‍රතික්ෂේපකර ඔහුගේ ජීවිතයට අවදානමක් ගත් විය. දෙවියන් වහන්සේ ඔහුට විශ්වාසවන්තව සිටි සේක. නෙබුකද්නේශර් රජතුමා සිහිනයක් දුටු විට එය සැලකිය යුතු තේරුමක් ඇති සිහිනයක් බව ඔහු දැන සිටයේය. එහි අර්ථය දැන ගැනීමට ඔහුට අවශ්‍ය වුවත් කිසිවෙකුට එහි අර්ථය පහදා දීමට නොහැකි විය. එම නිසා බැබිලෝනියේ සිටියා වූ ශාස්ත්‍රවන්තයන් සියලුදෙනාවම මරා දැමීමට රජතුමා සැලසුම් කළේය. දානියෙල් සිහිනය තේරුම් කර දෙන පිනිස ඒ රාත්‍රියේ කල් දෙන ලෙස රජුගෙන් ඉල්ලා තමා උදෙසා යාච්ඤා කරන ලෙස තම මිතුරන්ට ද කීවේය. දෙවියන් වහන්සේ එම සිහිනය ඔහුට පෙන්වා දී එහි අර්ථය ද පැහැදිලි කළ සේක. එහි ප්‍රතිඵලය ලෙෂ ශාස්ත්‍රවන්තයන් සියලු දෙනාගේ ජීවිත මරණ දඬුවමෙන් නිදහස් කරනු ලැබුවේය. එමෙනම දානියෙල්ව දෙවනියා බවට උසස් කරනු ලැබුවේය. මේ සියල්ලේ දී දෙවියන් වහන්සේ විශ්වාසවන්තව සිටි සේක.

දානියෙල් 6 වන පරිච්ඡේදයේ දී දාරියුස් රජු බවට පත්ව සිටියේය. ඔහු දානියෙල්ව රාජ්‍යයේ සියලු දිසාපතිවරුන්ට, අධිපතීන්ට සහ අමාත්‍යවරුන්ට වඩා ඉහළින් තැබුවේය. අනිත් අධිපතීන් දානියෙල් කෙරෙහි ඊර්ෂ්‍යාවී ඔහුගේ වරදක් අල්ලා ගන්නට සෙවීය. ඔවුන්ට දානියෙල්ගේ කිසිදු වරදක් සොයා ගැනීමට නොහැකි වූ අතර ඔවුන් දානියෙල් දවසකට තුන් වරක් දෙවියන් වහන්සේට යාච්ඤා කිරීම වරදක් සේ දක්වනපිණිස උපායක් යෙදුවෝය. රජතුමාගෙන් හැර වෙන කිසි මනුෂයෙකුගෙන් හෝ දෙවි කෙනෙකුගෙන් කිසිවක් ඉල්ලීමට නොහැකි බවට ඔවුන් රජතුමාගෙන් නියෝගයක් ලබා ගත්තේය. දානියෙල් පෙර කළ පරිදිම දවසකට තුන් වරක් නොකඩවා යාච්ඤා කළේය. ඒ නිසා රජුගේ ආඥාවට අනුව දානියෙල්ව සිංහගුහාවට දමනු ලැබීය. ඊළඟ දවසේ උදෑසන රජතුමා සිංහගුහාවේ දොරකඩ ළඟට පැමිණ මෙසේ මොරගැසීය. **"ඔහු ගුහාවට ළංවෙනකොටව ශෝක හඬකින් දානියෙල්ට මොරගැසුවේය. රජතෙමේ දානියෙල්ට කථා කොට ජීවමාන දෙවියන් වහන්සේගේ මෙහෙකරුවා වූ දානියෙල්, නුඹ නොකඩවාව සේවය කරන නුඹේ දෙවියන් වහන්සේට සිංහයන්ගෙන් නුඹ ගලවන්ට පුළුවන් වී දැයි ඇසුවේය."** (දානියෙල් 6:20) එවිට දානියෙල් **"රජුට කථාකොට රජ්ජුරුවෙනි ඔබ සදාකාලයටම ජීවත් වේවා. මගේ දෙවියන් වහන්සේ තමන්ගේ දූතයා එවා සිංහයන් මට අනතුරු නොකරන හැටියට උන්ගේ කටවල් පියවූ සේක. මක්නිසාද උන්වහන්සේ ඉදිරියෙහි මා තුළ නිදොස්කම තිබුණේය. ඇරත් රජ්ජුරුවෙනි, ඔබ ඉදිරියේ ද මම කිසි වරදක් නොකළෙමියි කීවේය"** දානියෙල් 6:21-22) මක්නිසාද, දෙවියන් වහන්සේ විශ්වාසන්තව සිටින සේක. දානියෙල් යාච්ඤා කළේ කාටද කියා ඔහු දැන සිටියේ ශුද්ධ ලියවිල්ලෙන් පමණක් නොව නමුත් තමන්ගේ අත්දැකීමෙනුත් එය දැන සිටියේය. උන්වහන්සේ විශ්වාසවන්තව සිටින සේක. දෙවියන් වහන්සේ දානියෙල්ට විශ්වාසවන්තව සිටි සේක. දෙවියන් වහන්සේ ඔබටත්, මටත් විශ්වාසවන්තව සිටින සේක. උන්වහන්සේ, උන්වහන්සේගේ පොරොන්දු වලටත්, උන්වහන්සේගේ විනිශ්චයටත් විශ්වාසවන්තව සිටින සේක. උන්වහන්සේ කවුරුන්ද යන්න උන්වහන්සේ තුළ සැබෑවී තිබේ.

දානියෙල් දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකම කෙරෙහි දැඩි විශ්වාසයෙන් සිටියේය. ඔහු මෙසේ කීවේය. **"අහෝ, ස්වාමීන් වහන්ස, ඔබට ධර්මිෂ්ඨකම අයිතිය..... "** (දානියෙල් 9:7) ඔහු කරන්නා වූ ප්‍රකාශයෙහි පදනම වූයේ ඔබවහන්සේ නෙබුකද්නේශර්ව එවා යෙරුසලම විනාශ කර දමනු ලැබූ සේක. එලෙස ඔබවහන්සේ හරිදේ කළ සේක. එය හරියට 2011 සැප්තැම්බර් මාසයේ ඇමරිකාවට එල්ල වූ ප්‍රහාරයට දෙවියන් වහන්සේ ඉඩ හැරිය සේක. උන්වහන්සේ එය කිරීම නිවැරදි බව ප්‍රකාශ කරන්නාක් මෙන්වේ. ඒක පිළිගන්න අමාරු දෙයක් නේද ... ? නමුත් දෙවියන් වහන්සේ එය සිදුවීමට ඉඩ හැරිය සේක. එමෙන්ම උන්වහන්සේ හරි දේ කළ බව අපට පැවසිය හැකිය. මක්නිසාද උන්වහන්සේ වැරදි දේ නොකරන සේක. උන්වහන්සේ සැමවිටම ධර්මිෂ්ඨව සිටින සේක. අපි කුරුසිය දෙස සහ කුරුසියේ සිටින පුත්‍රයාණන් වහන්සේ දෙස බලන විට දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකම අපි දකින්නෙමු. උන්වහන්සේ පාපය ඉවසා සිටින්නේ (පාපයට ඉඩ හරින්නේ) නැත. උන්වහන්සේ පාපය විනිශ්චය කරන සේක.

නමුත් දානියෙල් දෙවියන් වහන්සේගේ යහපත්කමත් විශ්වාස කළේය. ඔහු මෙසේ කීවේය. **"අපේ දෙවි වූ ස්වාමීන් වහන්සේ වෙත අනුකම්පාවත්, කමාවත් තිබේ....."** (දානියෙල් 9:9) කුරුසියේ දී යේසුස් වහන්සේ අපගේ පාපය දරා ගැනීම මත දෙවියන් වහන්සේ විනිශ්චයෙන් අපව මුදාගත් බව අපි දකින්නෙමු. ඔබගේ සහ මගේ පාපය වෙනුවෙන් යේසුස් වහන්සේ දෙවියන් වහන්සේ ඉදිරියේ මැදහත් වී අප උදෙසා විනිශ්චයට ලක් වූ සේක. කාසියක දෙපැත්ත මෙන් මේ පැති දෙකම ඔබට පෙනෙනවාද ... ? එක පැත්තක දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකම සහ විනිශ්චයත්, අනිත් පැත්තේ උන්වහන්සේගේ යහපත්කම සහ කරුණාවත් පවතින සේක. යෝවෙල් 2:12 14 පදවල ස්වාමීන් වහන්සේ පවසන්නේ "එහෙත් දැන්වත් " හැරී එන්න කියාය. ඔබ සහ මම අපේ සියලු පාප වලින් , නපුරුකම්වලින්, දුෂ්ඨකම් වලින් , දූෂිතවීම් වලින්, තණ්හාවෙන් (කෑදරකමින්) දුරාචාරයෙන් සහ ආත්මික නියඟයෙන් "දැන්වත් " අපේ මුළු හදවතින් අඬමින් ශෝක වෙමින්, නිරාහාරව සිටීමෙන් උන්වහන්සේ වෙතට හැරී එන්නේ නම් දෙවියන් වහන්සේ වෙතට දැනවත් අපගේ ඇඳුම් නොව අපගේ හදවත් ඉරාගෙන හැරී එන්නේ නම් දෙවියන් වහන්සේ හැරී ඇවිත් අපට ආශීර්වාදයක් වගුරුවාදී යනවා ඇද්දැයි දන්නේ කවුද ... ? දෙවියන් වහන්සේ දයාවන්තව සිටින සේක. උන්වහන්සේ යහපත්ය. අපගේ පියාණන් වහන්සේ යහපත් වූ පියාණන් වහන්සේය. උන්වහන්සේ සැමවිටම යහපත්ව සිටින සේක.

දානියෙල් දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය විශ්වාස කළේය. ඔහු පැවසුවේ **"ඉතින් ඔබගේ සෙනඟ බලවත් හස්තයකින් මිසර දේශයෙන් පිටතට ගෙනැවිත් අද දවසේ තිබෙන ලෙස ඔබට නාමයක් උපදවා ගත්තා වූ අපේ දෙවි වූ ස්වාමීන් වහන්ස ...."** (දානියෙල් 9:15) නැවතත් එය කළ මැනව, ඔබවහන්සේට පාරාවෝ රජුව පොළඹවා (වෙනස්කර) ඔබගේ සෙනඟව මුදා හැරීමට හැකි වූ සේක් නම්, පර්සියාවේ රජුවත් පොළඹවා ඔබගේ සෙනඟව මුදා හැරීමට පුළුවන්ව තිබෙන සේක. එමෙන්ම දෙවියන් වහන්ස, පර්සියාව වෙනස් කරන්නට පුළුවන් නම් යුදා සෙනඟව වෙනස් කරන්ටත්, යෙරුසලම නැවත ගොඩගන්නටත් දේව මාළිගාව නැවත ගොඩනගන්ටත්, ඔබ වහන්සේට පුළුවන්කම තිබෙන සේක. එසේ නම් උන්වහන්සේගේ පැමිණීම තුළ අපගේ දේශය (ඇමරිකාව) නැවත හරවාගෙන එන්නට බැරි ඇයි .... ? අපිව නැවත ඇදහිල්ලේ අත්තිවාරම වෙතට ගෙන එන්නට උන්වහන්සේට බැරිද .. ? මේ කාලයේ දී දෙවියන් වහන්සේගේ බලයේ සහ ශ්‍රේෂ්ඨත්වයේ කිසිදු

5 පිටුවට

4 පිටුවෙන්

# ඵලදායී යාච්ඤාව...

අඩුවීමක් සිදු වී නොමැත. දෙවියන් වහන්සේගේ බලය කිසි විටෙකත් අඩු වී නොමැත. උන්වහන්සේගේ එම ශ්‍රේෂ්ඨත්වයෙන්ම එම බලයෙන්ම සදාකාලයෙන් සදාකාලයට සර්ව බලධාරී දෙවියන් වහන්සේව සිටින සේක. උන්වහන්සේ මැවීම ආරම්භයේ දී සිටියාක් මෙන්ම, නෝවාගේ දවස්වලදී සිටියාක් මෙන්ම, මෝසෙස්ගේ, දාවිත්ගේ, දානියෙල්ගේ දවස්වලදීත් එලෙසම සිටි සේක. එම දෙවියන් වහන්සේම යේසුස් වහන්සේ ලෙස මනුෂ්‍යයන් අතරට පැමිණ මැරී නැවත මළවුන්ගෙන් නැගිට අපගේ දවස්වලදීත් එම දෙවියන් වහන්සේම ලෙසින් සිටින සේක. උන්වහන්සේගේ බලය, උන්වහන්සේගේ සර්වබලධාරීත්වය කිසි සේත් උන්වහන්සේගෙන් වෙන්වෙන්නේ නැත.

එම නිසා දානියෙල් යාච්ඤා කරන විට ඔහුට දෙවියන් වහන්සේ සමඟ තිබූ ගිවිසුමේ සම්බන්ධාවය තුළ දැඩි විශ්වාසයෙන් ඔහු යාච්ඤා කළේය. උන්වහන්සේගේ චරිත ගුණාංග ගැන ඔහු දැඩිව විශ්වාස කළේය. ඔබ යාච්ඤා කරන විට ඔබ යාච්ඤා කරන්නේ කොයිවගේ කෙනෙුට ද කියා ඔබ දන්නවාද .. ? ඔබ යාච්ඤා කරන දෙවියන් වහන්සෙගේ චරිත ගුණාංග ඔබ දන්නවාද .. ? උන්වහන්සේව සම්පූරණයෙන්ම ශුද්ධ ලියවිල්ලේ උන්වහ්නසේ අනාවරණය කරදී තිබෙන සේක. ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහනසේගේ පුද්ගලිකත්වය තුළ උන්වහන්සේව නිශ්චිතවම අනාවරණය කර තිබෙන සේක. දෙවියන් වහන්සේ කොයි ආකාරදැයි දැන ගැනීමට ඔබට අවශ්‍ය නම් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙස බලන්න. ඔබට උන්වහන්සේගේ හඬ ඇසීමට අවශ්‍ය නම් උන්වහන්සේගේ වචනය කියවන්න. දානියෙල් දෙවියන් වහන්සේ සමඟ තිබූ ඔහුගේ සම්බන්ධතාවය මත වැඩි විශ්වාසයක් ඇතිව තමන් යාච්ඤා කරන තැනැන් වහන්සේගේ චරිත ගුණාංග ගැන දැඩි විශ්වාසය ඇතිව සිටියේය. එමෙන්ම දානියෙල් මුහුණින් වැටී තමන්ගේ සෙනඟගේ පාපය ගැන පසුතැවිලි වූවායැයි මම සිතමි.

## පාපය ගැන පසුතැවිලීම

දානියෙල් ඔහුගේ පාපය පිළිබඳව පසුතැවිලි වෙද්දී ඔහු වචන සර්වනාම පදයක් භාවිතා කර තිබෙන බව ඔබ අවධානය යොමු කළා ද .. ? **"අපගේ පාපය" "අපගේ ලැජ්ජාව"** කියා ඔහු කීවේය. ඔබ දානියෙල් පිළිබඳව කියවන විට සැබවින්ම ඔහු ආදර්ශවත් පුද්ගලයෙකි. ඇත්ත වශයෙන්ම දානියෙල්ගේ ජීවිතයේ ඕනෑම පාපයක් සොයා ගැනීමට උත්සාහ කළ මනුෂ්‍යයන්ට ඔහුගේ ජීවිතයෙන් පාපයක් සොයා ගැනීමට නොහැකි විය. දවසට තුන්වරක් යාච්ඤා කිරීම පමණක් ඔවුන් සොයා ගත්තේය. නමුත් දානියෙල් ඔහුගේ සෙනඟගේ පාපය වෙනුවෙන් පසුතැවිලි වී යාච්ඤා කිරීම අවසානයේ දී මෙය සඳහන් වේ. **"මා කථා කර යාච්ඤා කරමින් ද, මාගේ පාපය සහ මාගේ සෙනඟ වූ ඊශ්‍රායෙල්වරුන්ගේ පාපයත් කියා දෙමින් ද .... "** (දානියෙල් 9:20)

අවසාන වතාවට ඔබගේ පාපය පිළිබඳව පසුතැවිලි වූයේ කවදාද ... ? මාගේ ජීවිතයේ මගේම පාපය මතුපිටින් පමණක් අවබෝධ කරගෙන තිබෙන බව මට පෙනුණේය. අවුරුදු කිහිපයකට පෙර මම පිඹීදීමේ රැළියක් සඳහා දවස් දහයක් නිශ්චලව සිටිමින් දේශනා කිරීම සඳහා දේශන හතක් පිළියෙල කිරීමට උත්සාහ කළෙමි. පළමුවෙනි දවසේ පණිවිඩයක් පිළියෙල කිරීම මම උත්සාහ කළත් කිසිවක් පැමිණියේ නැත. ඊළඟ උදෑසනත් මම එලෙසම උත්සාහ කළත් පැමිණියේ නැත. මම යාච්ඤා කරමින්, දෙවියන් වහන්ස මම මේ පණිවිඩය පිළියෙල කළ යුතු බව ඔබවහන්සේ දන්නවා එබැවින් ඔබවහන්සේ මෙම ඡේදය අනාවරණය කිරීම අවශ්‍යව තිබේ යැයි කීවෙමි. එහෙත් කිසිවක් පැමිණියේ නැත. මම ටිකක් බලාපොරොත්තු බිඳ වැටුණු තත්ත්වයකට පත්වූයෙමි. ඒ අතරම සිහින් හඬකින් "ඇනී" ... කියා මට කථා කරනවා මට ඇසුණේය. "මේ පණිවිඩය ගැන කතා කරන්නට මට උවමනා නැහැ. මට ඔබ ගැන කථා කරන්නට උවමනා යැයි මට කියනවා ඇසුණේය. " දෙවියන් වහන්ස ... මම ගැන කථා කරන්න නෙවෙයි, මට මේ පණිවිඩය ගැන කථා කිරීමට අවශ්‍යව තිබේ යැයි මම කීවෙමි. මම පණිවිඩය පිළියෙල කරගත්තාට පසුව මම ගැන කථා කිරීමට අපට පුළුවනැයි මම කීවෙමි." නිශ්ශබ්දතාවයක් පැවතුණේය. ඔබට දෙවියන් වහන්සේව පාලනය කළ (හැසිරවිය) නොහැකිය. ඒ නිසා අවසානයේ ද මම මගේ දණින් වැටී මෙසේ කීවෙමි. ඔබවහන්සේට මා ගැන කථා කරන්නට තිබෙන්නේ මොනවාද .. ? ඒ පිළිබඳව කථා කළ මැනවයි කීවෙමි.

ඒ අවස්ථාවේ දී කාලයකට ප්‍රථම උද්යෝගිමත් මනුෂ්‍යයෙක් ලියන ලද පිඹීදීමේ පත්‍රිකාවක් කරුණුකොටගෙන මගේ ජීවිතයේ පිඹීදීමේ ක්‍රියාවලිය පැතිරී ගියේය. ඔහු එම පත්‍රිකාවේ පාප ලැයිස්තුවක් පිළියෙල කර තිබූ අතර එය තුන් වරක කියවන්නැයි කියාද ඔහු කියා තිබුණේය. පළමු වතාවට මම ඒ පත්‍රිකාව කියවන විට ඒ පාප එකක්වත් මගේ ජීවිතයේ තිබුණේ නැති නිසා එම ලැයිස්තුව හොඳ යැයි කියා හැගුණේය. දෙවෙනි වර මම ඒ ලැයිස්තුව කියවන විට එම ලැයිස්තුවේ ඇති පාප වලින් දෙකක් හෝ තුනක් මගේ ජීවිතයේ විහිදී තිබෙන බව මට දැකීමට පුළුවන් විය. මගේ ජීවිතයේ මට දකින්නට හැකි වූ පාප ගැන ආත්මිකව යටහත් විය යුතු බව මට හැගුණේය. තුන්වෙනි වර මම ලැයිස්තුව කියවනවිට එහි සඳහන් සෑම පාපයක්ම එකකට පසුව එකක් මගේ ජීවිතයේ තිබෙන බව දුටුවෙමි. මම දෙවියන් වහන්සේ ඉදිරියෙහි මුහුණින් වැටුණෙමි. මෙය සිදුවූයේ මීට වසර දහයකට පෙර මම වසර තිහක් මගේ නිවසෙන් පිටත දේව සේවයේ යෙදී සිටියදීය. එහිදී මම දවස් හතක් කඳුළු සලමින් පසුතැවිලි වූයෙමි. මම මගේ බයිසිකලය දිග හරින විට මොනවාහරි දෙයකින් මම වරදකරුවෙක් බව එයින් මට පෙන්වා දුන්නේය. එය දිගටම සිදු විය. අවසානයේ දී දෙවියන් වහන්සේ උන්වහන්සේගේ කාර්යය අවසන් බව මට හඟවා දුන් සේක. මේ තුළින් නැවත වාරයක් යන්නට අවශ්‍ය නැති නිසා මම එය තහවුරු කරන පිණිස දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටියෙමි. උන්වහන්සේ මට ශුද්ධ ලියවිල්ලෙන් කථා කරමින් මෙසේකී සේක. "ඇනී ...., එය සම්පූර්ණයි. මම ඔබව පවිත්‍ර කළා. දැන් ඔබ මා සමඟ හරිගැස්සී තිබෙනවා." මම නාලා වගේ මාව තෙත්වෙලා තියෙනවා මට දැණුනා. ඉතිරි දවස් තුන තුළ මම දේශනය පිළියෙල කරගෙන සම්මන්ත්‍රණයට ගියෙමි. ආත්මිකව දිදුලන හැගීමක් මට දැණුනේය. මම පවිත්‍රව සිටින බව මට හැගුණේය. එහිදී දෙවියන් වහන්සේ සමඟ ඇති මගේ සම්බන්ධතාවය පැහැපත්වී ඇති බව මට සිතුණේය. මීට කලින් කිසිදාක නොතිබූ ලෙස උන්වහන්සේගේ බලය මගේ ජීවිතය තුළ ක්‍රියාත්මක විය.

## පුද්ගලික පාප උදෙසා පසුතැවිලිවීම

ඔබගේ ජීවිතයේ ඔබ නොදකින පාප පෙන්වාදීමට දෙවියන් වහන්සේට අවශ්‍යව තිබෙන බව මම විශ්වාස කරමි. මම නිශ්චලව සිටින විට දෙවියන් වහන්සේ මගේ ජීවිතයේ තිබෙන පාප පෙන්වාදීම මට අවශ්‍යව තිබේ. සමහර විට පාප ලැයිස්තු පත්‍රිකාව එම ක්‍රියාවලියට මට උපකාර විය. අනුගමනය කළ යුතු එවැනි ලැයිස්තුවක් පහතින් සඳහන් කරමි.

**<u>කළගුණ නොසැලකීම</u>** :- දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ආශිර්වාදය ලබාදීම වෙනුවෙන් හෝ යාච්ඤාවලට පිළිතුරු ලබාදීම වෙනුවෙන් ස්තුති කිරීමට නොහැකිව අසාර්ථකව සිටිම. (මම පසුතැවිලි වන්නෙමි.)

**<u>බයිබලය කියවීම අතපසු කිරීම</u>**:- දවසක් හෝ දවස් කිහිපයක් බයිබලය කියවන්නේ නැතිව සිටීම හෝ මම බයිබලයේ කියවූයේ කුමක්ද කියා මතකනැතිව සිටින්නෙමි. (මම පසුතැවිලි වන්නෙමි.)

**<u>අවිශ්වාසය</u>**:- දෙවියන් වහන්සේ මට පොරොන්දු වූදේ ලබා දෙනු ඇතැයි විශ්වාස නොකරමි. මක්නිසාද උන්වහන්සේ පොරොන්දු වූ දේ මට තවමත් ලබා දී නැත. ( මම පසුතැවිලි වන්නෙමි.)

**<u>යාච්ඤාව නොමැතිකම</u>**:- දෙවියන් වහන්සේ ඕනෑතරම් ආත්මිකව උන්වහන්සේ සමඟ කථා කිරීමට අපට අවස්ථාව දී තිබෙන සේක. සිතින් මවා ගැනීමට ප්‍රාර්ථනාවෙන් පූර්ණව සිතීමට හෝ යාච්ඤා කිරීම සඳහා සිතින් මවා ගැනීමට අවස්ථාව දී තිබෙන සේක. මම නිතර උද්යෝගිමත් නැතිව, ඇදහිල්ල ඉලක්ක කරගන්නේ නැතිව සිටියෙමි. (මම පසුතැවිලි වන්නෙමි.)

**<u>උඩඟුකම</u>**:- මම රහසින් විශ්වාස කරනවා මම වෙන කෙනෙකුට වඩා හොඳයි කියලා. මම වැරදියි කියලා මනුෂ්‍යයන් කියන විට මට කේන්ති යනවා. මම අමනාප වෙනවා. (මම පසුතැවිලි වන්නෙමි.)

**<u>ඊර්ෂ්‍යාව</u>** :- මට වඩා වැඩියෙන් හඳුනාගත හැකි (කැපී පෙනෙන) අය ගැන මම ඊර්ෂ්‍යයා කරන්නෙමි. වෙනත් කෙනෙකු ගැන ප්‍රශංසා (වර්ණනා) කරනවා ඇසෙන විට මම පොරබදන්නෙමි. ( මම පසුතැවිලි වන්නෙමි.)

**<u>විවේචනාත්මක ආත්මය</u>**:- මම අනිත් අයගේ අසාර්ථකවීම් සොයනවා. මක්නිසාද ඔවුන් මගේ ප්‍රමිතීන්ට අනුකූල නැත. (මම පසුතැවිලි වන්නෙමි.)

**<u>නින්දා අපහාස කිරීම</u>**:- මම යම් පුද්ගලයෙක් පිළිබඳව සත්‍ය කථා කරන චේතනාව ඔහු හෝ ඇය ගැන අනිත් අය නොසලකා සිටීමට (අඩුවෙන් සැලකීමට) සැලැස්වීමේ අදහස ඇතුව වේ. ( මම පසුතැවිලි වන්නෙමි.)

**<u>බොරුකාරකම (වංකකම)</u>**:- සම්පූර්ණ සත්‍ය නොවන දේ ගැන හෝ සත්‍යයේ අතිශෝක්තියක් වූ දෙයක් ගැන යමෙකුගේ සිත් ඇදගැනීමට මම උත්සාහ කළෙමි. ( මම පසුතැවිලි වන්නෙමි.)

**<u>කුහකකම</u>** :- මට නැති දේ ගැන මට තිබෙන බව අනිත් අයට පෙන්වන පිණිස බොරුවට මවා පෑවෙමි. (මම පසුතැවිලි වන්නෙමි.)

**<u>නොරිස්සුම් ගතිය</u>** :- මම දරුවන් සමඟ, භාර්යාව හෝ ස්වාමිපුරුෂයා සමඟ, සහකාර සේවකයන් සමඟ, මිතුරන් සමඟ, කාර්යාල සාමාජිකයන් සමඟ හෝ අනිත් පුද්ගලයන් සමඟ මට ඉවසීම නැති නිසා මම ඔවුන් සමඟ හරහට කථා කළෙමි. (මම පසුතැවිලි වන්නෙමි.)

**<u>නරක ලෙස දැඩිව සිටීම</u>**:- මම මාගේ හැඟීම්, සිතුවිලි, වචන, පාලනය කරගන්නේ නැති නිසා මම යම් අයව මගේ වචන වලින් ගැරහීමට ලක් කළෙමි. (මම පසුතැවිලි වන්නෙමි.)

**<u>අහංකාරය</u>**:- මම දෙවියන් වහන්සේගේ සමාවදීම ඒත්තුගන්නා (පිළිගන්නා) අතරම මම මටම හෝ වෙනත් කෙනෙකුට සමාවදීම ප්‍රතික්ෂේප කළෙමි. (මම පසුතැවිලි වන්නෙමි.)

එම ලැයිස්තුවේ තවත් 6 පිටුවට

5 පිටුවෙන්

# ඵලදායී යාච්ඤාව...

කාරණා දිගටම පැවතුණේය. රාගය, වෛශ්‍යකම, දුරාචාරය එවැනි තවත් කාරණාය, ඔබගේ ලැයිස්තුවේ තිබෙන්නේ මොනවාද ... ? පුද්ගලිකව යාච්ඤා කිරීමට කාලය ගන්න. මෙම ලැයිස්තුවේ සමහර කාරණා ක්‍රියාත්මකවීමට නම් ඔබ නැවත හැරී එය වරකට, දෙවරකට වඩා වැඩියෙන් කියවිය යුතුය. දෙවියන් වහන්සේ ඔබගේ සිහිකල්පනාවට සමහර කාරණා ගෙන එන්නේ නම් ඒවා ගැන උන්වහන්සේ ඉදිරියේ පසුතැවිලි වෙන්න.

මම අවුරුදු දහයකට ප්‍රථම මෙම පසුතැවිලිවීම තුළින් ගමන් කළ විට මට විනාඩි දෙකකින්, තුනකින් පසුතැවිලිවීමට හැකිවූයේ නැත. ඒ සඳහා මට දවස් හතක් ගතවිය. ඒ නිසා මේක සමහර විට ආරම්භය වෙන්නට ඇති කියා මම යාච්ඤා කළෙමි. ලැයිස්තුව හරහා නැවත ගමන් කරන විට දෙවියන් වහන්සේගේ මුහුණ ඉදිරියට ඔබට පැමිණිය හැකිය. දෙවියන් වහන්සේ මගේ ජීවිතයේ බොහෝ පාපිෂ්ඨ කාරණා පෙන්වා දුන් සේක. කුරුසිය ළඟට පැමිණීමට අපි කෙටි විස්තරයක් තබාගත යුතුය.

## ජාතියේ පාප උදෙසා පසුතැවිලිවීම

වරක් අපි අපේ පාප ගැන පසුතැවිලි වූයෙමු. ඊළඟට අපි අපගේ ජාතියේ පාප උදෙසා පසුතැවිලි විය යුතුය. අපේ පාප පිළිබඳව මුලින්ම පසුතැවිලිවීම තුළ පවතින විට අනිත් අයව විනිශ්චය කිරීමට ඇඟිල්ල දිගු කිරීම සහ තම ධර්මිෂ්ඨකම ප්‍රකාශ කිරීම වළක්වනු ලබනවා යැයි මම සිතමි. කුරුසිය පාමුල සියල්ලන්ම එකම මට්ටමේ සිටිති. අපි සියලුදෙනාම පව්කරුවන් වේ. ඔබත්, මමත්, කුරුසිය වෙතට පැමිණෙන විට අපට සමාවදී අපව මුදාගන්නා සේක. දෙවියන් වහන්සේට ප්‍රශංසා වේවා. අපි පාරට ගොස් වීදිය දිගේ ගමන් කරමින් ඔවුන්ව ගලවනු ලබන්නේ කොහොමද කියා අනිත් මනුෂ්‍යයන්ට කිව යුතුය. නමුත් අපි ඔවුන්ව හෙළා නොදැකිය යුතුය. මන්ද මේ වන විටත් ඔවුන්ව ඔවුන්ගේ පාපය නිසා හෙළා දමනු ලබා ඇත. යේසුස් වහන්සේ ඔවුන්ව ගලවා ගැනීම පිණිස මරණයට පත් වූ බව අපි ඔවුන්ට ප්‍රකාශ කළ යුතුය.

ජාතියේ පාපය පිළිබඳව පසුතැවිලිවීමට අපි කාලය වැය කළ යුතුවේ. දානියෙල් තමාගේ පාපය උදෙසා පසුතැවිලි වන බව ප්‍රකාශ කළේය. අපගේ ජාතියේ පාපයන් කිහිපයක ලැයිස්තුවක් මෙසේය.

අපේ අණුවනකමින් ඔබවහන්සේ සැබෑ ජීවමාන දෙවියන් වහන්සේ බව පිළිගැනීම ප්‍රතික්ෂේප කළනිසා අපි පසුතැවිලි වන්නෙමු. උන්වහන්සේ අපගේ මැවුම්කාර වූ අපි ගණන් දිය යුතු, හදිස්සියෙන් නොව සදාකාල වැදගත්කමකින්, අරමුණකින් සහ අර්ථයකින් අපගේ ජීවිතවල ජීවමාන ලෙස වාසය කරන ජීවමාන දෙවියන් වහන්සේ බව පිළිගැනීම ප්‍රතික්ෂේප කළ නිසා පසුතැවිලි වන්නෙමු.

අපි බොහෝ කාලයක් ඔබවහන්සේට බයව නොසිටීම නිසා, අපට ඇති විහාල දැනුම හැසිරවීමට ප්‍රඥාවේ ආරම්භය පවා අපට නැති බැවින් අපි පසුතැවිලි වන්නෙමු. අපේ ජාතියේ සඵලත්වය ලැබී තිබෙන්නේ අපි ශ්‍රේෂ්ඨ නිසා යැයි විශ්වාස කිරීමට අපි යොමු වී ඇති බැවින් සියලු ආශිර්වාද ඔබගේ දෑත්වලින් පැමිණ තිබෙන බව ප්‍රතික්ෂේප කරමින් ඔබවහන්සේට කෘතඥතාවය පලකර නොසිටීම ගැන අපි පසුතැවිලි වන්නෙමු. අපි අපගේ රැකවරණය සඳහා හමුදා ශක්තිය සහ අපගේ අවි ආයුධ විශ්වාස තබා ඔබවහන්සේව එපා කරමින් නොසලකාහරිමින්, මරණ්ඩුවී සිටින නිසා හිංසාවට, උපද්‍රවයට (අනතුරට) පත්ව සිටීම ගැන අපි පසුතැවිලි වන්නෙමු.

අපි පීඩනයට හසුව සිටීම නිසා අපගේ ආශාව එකවර තනතුරු කිහිපයක් දැරීම ඇතුළත්ව ඇති බැවින් ඔබවහන්සේ අනිත් දෙවිවරු අතර කෙනෙක් මෙන් ඒ ආකාරයෙන්ම ඔබවහන්සේටත් ගෞරව කිරීමට උත්සාහ දැරීම ගැන අපි පසුතැවිලි වන්නෙමු.

ඔබ වහන්සේ අපට ලබා දුන් භෞතික ආශිර්වාද නිසා ඔබවහන්සේව අපට අවශ්‍ය නැතැයි සිතීමට අපි ඉඩ හැර තිබෙන බැවින් අපි පසුතැවැලි වන්නෙමු.

අපි අපගේ පවුල් පිළිබඳව වගකීමකින් යුතුව විශ්වාසය ඔබවහන්සේ කුළ තබනවා වෙනුවට වෙනත් කෙනෙක් උපයාගත් දේවලට අපට අයිතියක් ඇතැයි යන හැඟීම ඇති කරගෙන සිටින බැවින් අපි පසුතැවිලි වන්නෙමු.

අපි ද්‍රව්‍යමය සඵලත්වය තුළින් ගෙනෙන්නා වූ ප්‍රීතිය තුළ ජීවත්වන බැවින් අපි පසුතැවිලි වන්නෙමු. අපගේ ජාතියේ ණය ඩොලර් බිලියන ගණන් වන ලෙස කැදරවීම ගැන අපි පසුතැවිලි වන්නෙමු.

අපගේ අහංකාරය, උඩඟුකම අපව මෙහෙයවීමට අපි ඉඩහැර අපගේ ජීවිත ගැන සෑහීමට පත්ව සිටින නිසා අපි පසුතැවිලි වන්නෙමු.

ජාතික ඇබ්බැහිවීම් වලින් ලිංගික ඇබ්බැහිවීම් වලින්, මුදලට ඇබ්බැහිවීම් වලින්, විනෝදයට ඇබ්බැහිවීම් වලින්, මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවීම් වලින්, මත්පැන්වලට ඇබ්බහිවීම් වලින්, අසභ්‍යය චිත්‍රපට දර්ශනවලට ඇබ්බැහිවීම් වලින්, ආහාරවලට, රූපවාහිනියට ඇබ්බැහිවීම් වලින්, ජනප්‍රියත්වයට ඇබ්බැහිවීම් වලින්, අපගේ ජීවිතවලට ඇබ්බැහිවීම් වලින් නිදහස ලැබෙන පිණිස පසුතැවිලි වන්නෙමු.

අපි සත්‍යතාවය නොවැදගත් සේ සලකන නිසා, බොරුව ප්‍රධානකොට ගෙන ගිය බැවින් අපි පසුතැවිලි වන්නෙමු.

අපි බොහෝ දෙවිවරු යටතේ එක ජාතිකයක් වී සිටින්නෙමු. බෙදීම්වලට, පාපයට අවසර ලබාදෙන්නෙමු. යුක්තියේ නීති රෙගුලාසි නිතරම අනුගමනය නොකර සිටින්නෙමු. ඒ ගැන පසුතැවිලි වන්නෙමු.

දෙවියන් වහන්සේගේ කරුණාව අප මත තබා තිබේ. දැන් අපගේ ජාතිය දෙවියන් වහන්සේගේ මෙහෙයවීමට පැමිණෙන පිණිස යාච්ඤා කිරීමට මම ඔබට ආරාධනා කරමි.

## ජාතික පසුතැවිලිවීමේ යාච්ඤා කිරීම

යෙසායා අනාගතවකතෘ මෙන් යාච්ඤා කරන්නෙමු. අපගේ ජීවිත අපවිත්‍රව තිබෙනවා පමණක් නොව සෙනගක් වශයෙන් ද අපි අපවිත්‍රව සිටින්නෙමු. දෙවියන් වහන්සේගේ සෙනඟ පව්කර දෙවියන් වහන්සේගෙන් ඈත්ව සිටින්නෝය. අපි ද්විතීය කථාව 28 : 1-14 දක්වා පදවල පදනම මත සිට අපගේ ජාතිය වෙනුවෙන් යාච්ඤා කරමු.

දානියෙල් ජාතිය වෙනුවෙන් යාච්ඤා කරද්දී දෙවියන් වහන්සේගෙන් මෙලෙස ඉල්ලා සිටියේය. **"ස්වාමිනී... , අනේ ඔබගේ සියලු ධර්මිෂ්ඨකම් ලෙස ඔබගේ උදහසත්, කෝපයත්, ඔබගේශුද්ධ වූ කන්ද වන ඔබගේ නුවර වූ යෙරුසලමෙන් පහවේවා. මක්නිසාද අපේ පාප සහ අපේ පියවරුන්ගේ අපරාධ නිසා යෙරුසලම සහ ඔබගේ සෙනඟ අප වටකර සිටින සියල්ලන්ට නින්දාවක් වී තිබේ. "** (දානියෙල් 9:16) **"ස්වාමීන්වනහන්ස .... , ඇසුව මැනව, ස්වාමීන් වහන්ස ...., කමාවුව මැනව. ස්වාමීන් වහන්ස ....,ඇහුම්කන් දුන මැනව. මාගේ දෙවියන් වහන්ස, ප්‍රමාද නොවී ඔබ නිසාම එය ඉෂ්ඨ කළ මැනව. මක්නිසාද ඔබගේ නුවරත්, ඔබගේ සෙනඟත් ඔබගේ නාමය දරන්නෝ යයි කීවෙමි. "** (දානියෙල් 9:19)

දානියෙල්ගේ යාච්ඤා කිරීමේ අවසානයේ දී දෙවියන් වහන්සේ පිළිතුරු දෙමින් ස්වර්ගීය ක්‍රියාව ඉටු කළ සේක. **"මා කථා කර යාච්ඤා කරමින් ද මාගේ පාපය සහ මාගේ සෙනඟ වූ ඊශ්‍රායෙල්වරුන්ගේ පාපයත් කියා දෙමින්ද, මාගේ දෙවියන් වහන්සේගේ ශුද්ධ වූ කන්ද උදෙසා මාගේ දෙවි වූ ස්වාමීන් වහන්සේ ඉදිරියෙහි මාගේ කන්නලව්ව ඔප්පු කරමින් ද සිටින අතර එසේය. මා යාච්ඤා කරමින් කථා කරද්දීම පළමු මා දර්ශනයෙන් දුටු මනුෂ්‍යයා වූ ගාබ්‍රියෙල් යුහුව ගමන්කොට සවස් පූජාවේ වෙලාවට පමණ මා ළඟට පැමිණියේය. ඔහු මට උගන්වා මා සමඟ කථාකොට එම්බා දානියෙල් තේරුම් ගැනීමේ දක්ෂකම නුඹට දෙන්ට දැන් පිටත්ව ආවෙමි. නුඹේ කන්නලව්වේ පටන් ගැනීමේදී ආඥාවක් ලැබ මම නුඹට දන්වන්ට ආවෙමි. මක්නිසාද නුඹ බොහෝ ප්‍රේම ලද්දෙක්ය. ඒ නිසා කාරණය කල්පනාකොට දර්ශනය තේරුම් ගනින්න."** (දානියෙල් 9,20 - 23)

දානියෙල් දෙවියන් වහන්සෙ සහ සෙනඟ අතරේ කඩුල්ලේ සිටියේය. දානියෙල්ගේ යාච්ඤාව තුළ ස්වර්ගීය ක්‍රියාව ඉටුවී දානියෙල්ගේ ජාතියේ ස්වභාවය වෙනස් විය. පර්සියාවේ රජු වූ සියරස් යුදා සෙනඟව වහල්කමින් නිදහස් කර තම දේශයට යාමට අවසර ලබාදෙමින් ගමනට අවශ්‍යය මුදල් ද, දේවමාළිගාව සහ නුවර පවුර නැවත ගොඩනැගීමට අවශ්‍යය උපකාරය ද ලබා දුන් සේක. අපගේ දෙවියන් වහන්සේ යාච්ඤාව අසන්නා වූ, යාච්ඤාවට පිළිතුරු දෙන්නා වූ ආශ්චර්යමත් ක්‍රියාව ඉටුකරන්නා වූ දෙවියන් වහන්සේ වන සේක. දෙවියන් වහන්සේගේ වචනයට අනුව අපි උන්වහන්සේ වෙතට පැමිණෙන විට, යාච්ඤා කරන විට උන්වහන්සේගේ මුහුණ සොයන විට, අපගේ ජීවිත යටත් කරමින් අපගේ පාපය ගැන පසුතැවිලි වන විට, ඊළඟට අපි උන්වහන්සේ සමඟ ඇති ගිවිසුමේ සම්බන්ධතාවය හරිගස්වා ගැනීම තුළ උන්වහන්සේගේ පොරොන්දුව හිමිකර ගන්නෙමු. උන්වහන්සේ ඇහුම්කන්දී, සමාවදී, සුවකරන සේක.

ශුද්ධ දෙවියන් වහන්සේ ධර්මිෂ්ඨ දෙවියන් වහන්සේ වන සේක. දයාවෙන් පූර්ණ වූ දෙවියන් වහන්සේ වන සේක.අපි ඔබගේ නාමයෙන් එක්ව සිටින්නෙමු. අපි ශුද්ධ ලියවිල්ලේ උත්පත්ති 1:3 මත නැගිට සිටින්නෙමු. **"දෙවියන් වහන්සේ එළිය වේවයි කී සේක. එවිට එළිය විය. "** අපට ලෝකයට ආලෝකයක්වීමට උපකාර කළ මැනව. **"නුඹලා ලෝකයේ ආලෝකයය. කන්දක් මුදුනෙහි තිබෙන නුවරක් සඟවන්ට නොහැකිය. "** (මතෙව් 5:14)

සත්‍යතාවය වැළඳගැනීමට අපට උපකාර කළ මැනව. ගීතිකාකරුවාගේ වචන තුළම කාවැදීමට අපට උපකාර කළ මැනව. **"ඊශ්‍රායෙල් දැන් මෙසේ කියත්වා. අපේ පක්ෂයෙහි සිටියේ ස්වාමීන් වහනසේ නොවී නම් මනුෂ්‍යයන් අපට විරුද්ධව නැගිටින කළ අපේ පක්ෂයෙහි සිටියේ ස්වාමීන් වහන්සේ නොවී නම්, ඔවුන්ගේ උදහස අපට විරුද්ධව ඇවුළුණ කළ ඔවුන් අප පණපිටිනේ ගිලගන්ට තිබුණේය. එකල්හී ජලය අප වසාගන්නවා ඇත. දියපාර අපේ ප්‍රාණය යටකොට ගලනවා ඇත. එකල්හී උඩඟු ජලය අපේ ප්‍රාණය යටකොට ගලනවා ඇත. "** (ගීතාවලිය 124 : 1-5 )

**"ඔබගේ ක්‍රියාව ඔබගේ මෙහෙකරුවන්ටත්, ඔබගේ තේජස ඔවුන්ගේ දරුවන් කෙරෙහිත් පෙනේවා." (ගීතාවලිය 90:16)**

# පිබිදීම සඳහා ස්වාමීන් වහන්සේ දෙස බලා සිටින්න.

රිච් කාර්මයිකල් විසිනි

සමහර අය ඇමරිකා එක්සත් ජනපදය තුළපිබිදීම ඇතිවීමට නොහැකි බවට තර්ක කරති. ඒ සඳහා උපකාරවන්නා වූ සාක්ෂි බොහෝමයක් මේ දවස්වලදී නිශ්චිතවම පවතින්නේය. ආත්මික ස්වභාවය තුළට සහ සදාචාරය තුළට ගින්දර කඩා හැලනවා මනුෂ්‍යයන් දැකිය යුතුය. දේශපාලන බෙදීම් සහ සමාජීය කැළඹීම් (උද්ඝෝෂණ) තියුණු වී තිබේ. ජාතියේ සෙනඟ අතිරින් බොහෝ දෙනා සැබෑ සහ ජීවමාන දෙවියන් වහන්සේ ගැන අවබෝධයක් නැතුව සිටින්නෝය. දෙවියන් වහන්සේට සහ උන්වහන්සේගේ වචනයට ගෞරව කිරීමේ හැඟීමෙන් ඈත්ව සිටින්නෝය. බොහෝ ක්‍රියා මාර්ගවල ඇති වාතාවරණය බලාපොරොත්තු රහිතවීම බව පෙනෙන්නේය.

ඒ අතරම තත්ත්වය කොපමණ අසතුටුදායක වුවත් අපේ දෙවියන් වහන්සේ බලවත්ව සිටින නිසා ප්‍රශ්ණයක් නොමැත. ඒ අතරම අපි විලාප නගනාව හැගෙන්නේය. මාගේ සවියත්, ස්වාමීන් වහන්සේ කෙරෙන් මාගේ බලාපොරොත්තුවත් නැතිවී ගියේ යැයි කීමි. (විලාප - 3:18) ඊළඟට අපට මෙලෙස ප්‍රීතියෙන් හුස්ම ගැනීමට හැකිවේ. **“මාගේ කොටස නම් ස්වාමීන් වහන්සේ යයි මාගේ ආත්මය කියයි. එබැවින් උන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වන්නෙමි.”** (විලාප ගී 3:24 ) අපගේ දෙවියන් වහ්නසේ මරණයෙන් ජීවනයට ගෙනෙන සේක. (එසකියෙල් 37 : 1-14) උන්වහන්සේ අසාධ්‍යව තිබෙන තුවාල සුවකරන සේක. (යෙරමියා 30 : 12-17) උන්වහන්සේමෙසේ අණ කරන සේක. **“එසේය, යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මුහුණෙහි දෙවියන් වහන්සේගේ තේජස දැනගැන්ම නැමති ආලෝකය බැබළෙන පිණිස අපගේ සිත්වල බැබැළවේ අන්ධකාරයෙන් ආලෝකය බැබලෙන්ට කීවාවූ දෙවියන් වහන්සේය.”** ( 2 කොරින්ති 4:6) උන්වහන්සේ උල්පත් විවර කරන සේක. **“මම මුඩු කඳු මුදුන්වල ගංගා ද, මිටියාවත් මැද උල්පත්ද, විවර කරන්නෙමි. කාන්තාරය දිය පොකුණක් ද වියළි දේශයන් ජල උල්පත් ද කරන්නෙමි.”** (යෙසායා 14:18)

ස්වාමීන් වහන්සේ කෙරෙහි බලාපොරොත්තුව ඇති මේ ජාතියේ ඇදහිලිවන්තයන්ගේ ඉතිරි කොටසක් තවමත් සිටින බව දැන ගැනීම කොයිතරම් යහපත් ද ..... ? එමෙන්ම දෙවියන් වහන්සේගේ පිබිදීම උදෙසා උන්වහන්සේ දෙස බලා සිටින්නේ කවුද ..? මේ වර්ෂයේ ජාතික යාච්ඤා දිනයේ දී මෙම සත්‍යතාවය වෙනුවෙන් විවිධාකාරයේ කණ්ඩායම් එකතුවී ආත්මක උද්යෝගය සඳහා යාච්ඤා කරන පිණිස තිස්පන්දාහක්, හතලිස්දාහක් අතර පිරිසක් සිටින බව ගණන් බලා ඇත. ශුද්ධ ලියවිල්ලේ සහ සභා ඉතිහාසයේ දෙවියන් වහන්සේගේ සෙනඟ උන්වහන්සේ මතක් කර දෙන කාරණාවලට නැවත හැරෙන ලෙස ප්‍රතිචාරය දක්වන විට දෙවියන් වහන්සේ කරන්නා වූ යහපත් දේ අපි හොඳින්ම දනිමු. අපි ජීවිතවලින් යටහත් වී යාච්ඤා කර උන්වහන්සේගේ මුහුණ සොයා පසුතැවිලි වෙද්දී උන්වහන්සේ සමාවදී, මැදහත් වෙමින් සුවය මිදීම, උද්යෝගය ලබා දෙන සේක. ඇමරිකාව තුළ කණකාටුදායක තත්ත්වයේ කාර්යයන් පවතින්නේය. දෙවියන් වහන්සේගේ දරුවන් වශයෙන් අපගේ කාර්යභාරය ලෝකය අත්‍යවශ්‍ය වේ.

පෙරමග දූතයා මෙම කලාපයෙන් ඔබ සියලු දෙනාවම පිබිදීම උදෙසා පසුතැවිලිවී යාච්ඤා කිරමට ධෛර්යමත් කිරීම ඉලක්ක කරගෙන ඇත. දානියෙල් 9:1-23 දක්වා බයිබල් කොටසත් ඊට ඇතුළත් කර ගනිමු.

**“කල්දිවරුන්ගේ රාජ්‍යය කෙරෙහි රජකමට පත්කරනු ලැබූවා වූ, මේ දරුවන්ගේ වංශයේ අහෂ්වේරොස්ගේ පුත්‍ර වූ දාරියසුගේ පළමුවෙනි අවුරුද්දේදී එනම් ඔහුගේ රජකම් කිරීමේ පළමුවෙනි අවුරුද්දේ දී යෙරුසලම පාළුව තිබීමේ සම්පූර්ණත්වයයි ස්වාමීන් වහන්සේ අනාගතවක්තෘ යෙරමියා ලවා කියෙවූ අවුරුදු ගණන සැත්තෑ අවුරුද්දක් බව දානියෙල් වන මම පොත් වලින් තේරුම් ගත්තෙමි. එවිට මම නිරාහාරව ගෝණි රෙදිද, අළු ද ඇතුව යාච්ඤාවෙනුත්, කන්න්ලව්වෙනුත් ස්වාමී වූ දෙවියන් වහන්සේ සොයන පිණිස මාගේ මුහුණ උන්වහන්සේ දෙසට හරවා මාගේ දෙවි වූ ස්වාමීන් වහන්සේට යාච්ඤාකොට පව් කියා දෙමින් මෙසේ කීමි. අහෝ .... ස්වාමීන් වහන්ස, ඔබට ප්‍රේමකොට ඔබගේ ආඥා රක්ෂා කරන්නන්ට ගිවිසුමත්, කරුණාවත් පවත්වන්නා වූ මහත් වූ භයංකර වූ දෙවියන් වහන්ස, අපි පව්කොට, අයුතුකම්කොට, දුෂ්ඨකම්කොට, කැරළි ගසා , ඔබගේ ශික්ෂා වලින්ද, ඔබගේ විනිශ්චය වලින්ද ඉවත්ව ගියෙමුව. ඔබවහන්සේගේ නාමයෙන් අපේ රජවරුන්ටත්, අපේ අධිපතීන්ටත්,අපේ පියවරුන්ටත්, දේශයේ වැසියන් වූ සියල්ලන්ටත් කථා කළඅනාගත වක්තෘවරුන් වූ ඔබගේ මෙහෙකරුවන්ට අපි ඇහුම්කන් නුදුන්නෙමුව. අහෝ, ස්වාමීන් වහන්ස, ඔබට ධර්මිෂ්ඨකම අයිතිය. නමුත් අද දවසේ තිබෙන්නාක් මෙන් මුහුණු ලැජ්ජාව අපට අයිතිය. එනම් යුදාහී මනුෂ්‍යයන්ටත්, යෙරුසලමේ වැසියන්ටත් ඔබට විරුද්ධව කළ ද්‍රෝහිකම නිසා ඔබ විසින් පන්නා දමනු ලැබ සියලු රටවල ළඟ සිටින්නාවූ ද, දුර සිටින්නා වූ ද සියලු ඊශ්‍රායෙල්වරුන්ටත්ය. ස්වාමීන් වහන්ස ...., අප විසින් ඔබට විරුද්ධව පව් කළ නිසා අපට එනම් අපේ රජවරුන්ටත්, අපේ අධිපතීන්ටත්, අපේ පියවරුන්ටත් මුහුණු ලැජ්ජාව අයිතිය. අපේ දෙවි වූ ස්වාමීන් වහන්සේ වෙත අනුකම්පාවෙන් කමාවල් තිබේ. මක්නිසාද අපි උන්වහන්සේට විරුද්ධව කැරළිගැසීමුව. අපේ දෙවි වූ ස්වාමීන් වහන්සේ ප්‍රොපේතවරුන් වන තමන්ගේ මෙහෙකරුවන් ලවා අප ඉදිරියෙහි තැබූ උන්වහන්සේගේ ව්‍යවස්ථාවල ප්‍රාකාරයට හැසිරෙන ලෙස අපි උන්වහන්සේගේ හඬට කීකරු නොවීමුව. එසේය. සියලු ඊශ්‍රායෙල්වරු ඔබගේ ව්‍යවස්ථාව කඩකොට ඔබගේ හඬට කීකරු නොවන ලෙස අහක්ව ගියෝය. මෙසේ අප උන්වහන්සේට විරුද්ධව පව් කළ බැවින් දෙවියන් වහන්සේගේ මෙහෙකරුවා වූ මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ ලියා තිබෙන ශාපය ද දිවුරුම ද අප කෙරෙහි වගුරුවා තිබේ. එසේ යෙරුසලමට සිද්ධ වුණ හැටියට මුළු අහස යට ස්ද්ධනූණ ආකාර මහත් විපතක් අප කෙරෙහි පැමිණවීමෙන් උන්වහන්සේ අපටත් අප විනිශ්චය කළ අපේ විරුද්ධකාරයන්ටත් විරුද්ධව කී වචන ඉෂ්ඨකළ සේක.”**

**“මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ ලියා තිබෙන ලෙස මේ මුළු විපත්තිය අප පිටට පැමුණුණේය. එහෙත්,අපේ අයුතුකම්වලින් හැරී ඔබගේ සැබෑකම තේරුම් ගන්නා පිණිස අපේ දෙවි වූ ස්වාමීන් වහ්නසේට අපි කන්නලව් නොකළෙමුව. එබැවින් ස්වාමීන් වහන්සේ විපත්තිය ගැන පිබිද සිට ඒක අප පිටට පැමිණ වූ සේක. මක්නිසාද අපේ දෙවි වූ ස්වාමීන් වහන්සේ තමන් කරන තමන්ගේ සියලු ක්‍රියාවල් ගැන ධර්මිෂ්ඨව සිටින සේක. අපි උන්වහන්සේගේ හඬට කීකරු නොවීමුව. ”**

**ඉතින් ඔබගේ සෙනඟ බලවත් හස්තයකින් මිසර දේශයෙන් පිටපතට ගෙනැවිත් අද දවසේ තිබෙන ලෙස ඔබට නාමයක් උපදවාගත්තා වූ අපේ දෙවි වූ ස්වාමීන් වහන්ස, අපි පව්කළෙමුව, දුෂ්ඨකම් කළෙමුව. ස්වාමීනී, අනේ ඔබගේ සියළු ධර්මිෂ්ඨකම් ලෙස ඔබගේ උදහසත්, කෝපයත් ඔබගේ ශුද්ධ වූ කන්ද වන ඔබගේ නුවර වූ යෙරුසලමෙන් පහවේවා. මක්නිසාද අපේ පාප සහ අපේ පියවරුන්ගේ අපරාධ නිසා යෙරුසලම සහ ඔබගේ සෙනඟ අප වටකර සිටින සියල්ලන්ට නින්දාවක් වී තිබේ. ඒ නිසා අපේ දෙවියන් වහන්ස, ඔබගේ මෙහෙකරුවාගේ යාච්ඤාවද ඔහුගේ කන්නලව්ව ද අසා පාළුව තිබෙන ඔබගේ ශුද්ධස්ථානය කෙරෙහි ඔබගේ මුහුණ ස්වාමීන් වහන්සේ නිසා බැබලෙව්ව මැනව. මාගේ දෙවියන් වහන්ස, ඔබගේ කන් නමා ඇසුව මැනව. ඔබගේ ඇස් ඇර අපේ අසරණකම ද, ඔබගේ නාමය දරණ නුවර ද බැලුව මැනව, මක්නිසාද අපේ කන්නලව්ව අප විසින් ඔබ ඉදිරියෙහි ඔප්පු කරන්නේ අපේ ධර්මිෂ්ඨකම් නිසා නොව, ඔබගේ මහත් අනුකම්පාවල් නිසාය. ස්වාමීන් වහන්ස, ඇසුව මැනව, ස්වාමීන් වහන්ස, කමාවුව මැනව, ස්වාමීන් වහන්ස, ඇහුම්කන් දුන මැනව, මාගේ දෙවියන් වහන්ස ප්‍රමාද නොවී ඔබ නිසාම එය ඉෂ්ඨ කළ මැනව. මක්නිසාද ඔබගේ නුවරත්, ඔබගේ සෙනඟත් ඔබගේ නාමය දරන්නෝ යයි කීවෙමි.”**

**“මා කතාකර යාච්ඤා කරමින් ද, මාගේ පාපය සහ මාගේ සෙනඟ වූ ඊශ්‍රායෙල්වරුන්ගේ පාපයත් කියාදෙමින් ද, මාගේ දෙවියන් වහන්සේගේ ශුද්ධ වූ කන්ද උදෙසා මාගේ දෙවි වූ ස්වාමීන් වහන්සේ ඉදිරියෙහි මාගේ කන්නලව්ව ඔප්පු කරමින් ද සිටින අතර එසේය, මා යාච්ඤාවෙන් කථා කරද්දීම පළමු මා දර්ශනයෙන් දුටු මනුෂ්‍යයා වූ ගාබ්‍රියෙල් යුහුව ගමන්කොට සවස පූජාවේ වේලාවට පමණ මා ළඟට පැමිණියේය. ඔහු මට උගන්වා මා සමඟ කථාකොට, එම්බා දැනියෙල් තේරුම් ගැනීමේ දක්ෂකම නුඹට දෙන්න දැන් පිටත්ව ආවෙමි. නුඹේ කන්නලව්ව පටන් ගැනීමේ දී ආඥාවක් ලැබ මම නුඹට දන්වන්ට ආවෙමි. මක්නිසාද නුඹ බොහෝ ප්‍රේම ලද්දෙක්ය. ඒ නිසා කාරණය කල්පනාකොට දර්ශනය තේරුම් ගනින්න.” (දානියෙල් 9:1-23)**

ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ මහත් වූ කරුණාව එවා ආත්මිකව පිබිදෙන පිණිස ලොව වටා සිටින්නා වූ උන්වහන්සේගේ සෙනඟව යළි උද්යෝගිමත් කර විනාශය කරා ගමන් කරන බොහෝ සෙනඟව ගැලවීම වෙතට සහ අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නැවත පැමිණීමේ මහිමාන්විත බලාපොරොත්තුව වෙතට ගෙනෙන සේක්වා.

**“මා සමඟ ස්වාමීන් වර්ණනා කරව්, අපි එක්ව උන්වහන්සේගේ නාමය උසස් කරමු” (ගීතාවලිය 34:3)**

Reg. No: QD/NEWS/15/2022
30/7,A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.



# නිදා සිටින ඔබ අවදිවන්න.

වර්තමාන ලෝකයේ සදාචාරය සොදොම සහ ගොමෝරාවේ තත්වයට සමීප වෙමින් පවතියි. ඒ කාලයේ දී දෙවියන් වහන්සේ සොදොම ගොමෝරාව විනිශ්චය කළ සේක. අද දවසේ අපි දෙවියන් වහන්සේගේ විනිශ්චයෙන් ගැලවී සිටීමට අනුමාන කළ හැකි හේතුව කුමක්ද ... ? ඒ අතරම උත්පත්ති 18 වන පරිච්ඡේදය අධ්‍යනය කිරීමෙන් දෙවියන් වහන්සේට බියවීමේ තත්ත්වයක් නගරය මධ්‍යයේ තිබේ නම් නගරය බේරා ගැනීමට දෙවියන් වහන්සේ මැදිහත්වීමට විවෘතව සිටින බව අනාවරණය වේ. දේව වචනයේ මෙලෙස පවසන සේක. **"එහෙයින් නිදන්නා වූ නුඹ පිබිද මළවුන්ගෙන් නැගිටපන්න. එවිට ක්‍රිස්තුස් වහන්සේ නුඹ කෙරෙහි උදාවන සේකැයි උන්වහන්සේ කියන සේක. "** (එපීස 5:14)

පොළොවේ මේ තීරණාත්මක මොහොතේ කිතුණුවන් ලෙස අප අවදිව සිටින්නේ කෙසේද .. ? ලොව වටා ඉතා තියුණු ලෙස භයංකරව ත්‍රස්තවාදය පැතිර යමින් පවතියි. සමූල ඝාතක අවිවල තර්ජනය ලොව පුරා දැඩිව එල්ලවී තිබේ. එසේ තිබියදීත් සාමාන්‍ය පුද්ගලයා තීරණාත්මක තත්ත්වය ගැන කරදරවීම තරම් ජීවිතයේ සුළු දේවල නියැලී සිටින්නෝය. ආසන්නයේ තිබෙන අනතුරක් හමුවේ උදාසීනව සිටීම මනුෂ්‍යයන්ගේ ලක්ෂණයක් බවට පත්ව තිබෙන බව පෙනෙන්නට ඇත.

අපගේ ස්වාමීන් වහන්සේ නැවත පොළොවට පැමිණෙන විට සෙනඟගේ උදාසීන, නොදැනුවත් ආකල්ප ගැන කලින් ප්‍රකාශ කර ඇත. **"නෝවාගේ දවස් මෙන් මනුෂ්‍ය පුත්‍රයාගේ ඊමත් වන්නේය. මක්නිසාද ජල ගැලීමට පළමු දවස්වලදී නෝවා නැවට ඇතුල් වූ දවස දක්වා ඔව්හු කමින් බොමින් සරණ පාවා ගනිමින්, සරණ පාවා දෙමින් සිටියෝය. ජලගැල්ම පැමිණ සියල්ලන්ම ගසාගෙන යන තුරු ඔවුහු නොදැන සිටියෝය. මනුෂ්‍යයා පුත්‍රයාගේ ඊමත් එලෙසම වන්නේය."** (මතෙව් 24:37-39 )

යේසුස් වහන්සේගේ දෙවන පැමිණීමේ දී ගැලවීම නොලැබුවා වූ අයගේ ජීවිතවලට හදිස්සියේම මහත් ඛේදවාචකයක් (ව්‍යසනයක්) ඇති වේ. එසේ වුවත් බොහෝ දෙනා පසුතැවිලිවීමට සහ දෙවියන් වහන්සේ සමඟ හරිගැස්සීමට උත්සාහ දරන්නේ නැත. අපගේ ලෝකය තුළ මනුෂ්‍යයන් මුළුමනින්ම උදාසීන අනතුරුදායක තත්ත්වයට මුහුණ පා තිබෙන බව දකින්නට ඇත. **"මක්නිසාද දේවදූතයන් පව්කළ විට දෙවියන් වහන්සේ ඔවුන්ට දඬුවම් නොකර නැවත විනිශ්චය පිණිස ඉතුරුකොට තැබීමට නිරයෙහි හෙළා අන්ධකාරයේ ගුහාවලට භාරදුන් සේක් නම් උන්වහන්සේ අභක්තීන්ගේ ලෝකය පිට ජලගැල්මක් පැමිණෙවූ කළ පුරාණ ලෝකය ඉතිරි නොකොට ධර්මිෂ්ඨකමේ දේශනාකාරයෙක් වූ නෝවා තවත් සත් දෙනෙකුත් සමඟ ආරක්ෂා කළසේක් නම්, සොදොම හොමෝරාව යන නුවරවල් අළුකරමින් ඒවා පෙරළා දමා විනාශයට නියමකොට මතු අභක්තික ලෙස හැසිරෙන්නන්ට ඒවා ආදර්ශයක් කළ සේක් නම් ....."** ( 2 පේත්‍රැස් 2: 4-6)

බොහෝ මනුෂ්‍යයන් ආගමිකයන්ව සිටිති නමුත් ධර්මිෂ්ඨ ජීවිතයක් සඳහා ආගම දික්කසාද තත්ත්වයට පත්කර ඇත. සොයාසා ඊශ්‍රායෙල් සෙනඟ පිළිබඳව මතක් කර දේනනේය. ඒ කාලයේ දී නමස්කාරයේ හරය නැතිව, අවංකකම නැතිව දෙවියන් වහන්සේට නමස්කාර කළේය. **"අනේ පාපිෂ්ඨ ජාතියක්ය. අයුතුකමෙන් බරවූ සෙනඟක්ය. නපුරුකම් කරන වංශයක්ය. දූෂ්‍ය ලෙස ක්‍රියාකරන දරුවෝය. ඔවුහු ස්වාමීන් වහන්සේ අතහැර ඊශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන් වහන්සේ එපා කොට වෙන් වී පස්සට හැරී ගියෝය."** (යොසායා 1:4) **"නුඹලාගේ පූජා රාශියෙන් මට කම් කිම්දැයි ස්වාමීන් වහන්සේ කියන සේක. මුළු බැටළු පූජාවලින්ද, තරකල සතුන්ගේ තෙලින්ද පිරී සිටිමි. ගොනුන්ගෙත්, බැටළු වස්සන්ගෙත්, එළුවන්ගෙත් ලෙයට මම ප්‍රසන්න නොවෙමි."** (යෙසායා 1:11) **"නිශ්ඵල පූජා තවත් නොගෙනෙල්ලා දුම් පූජාව මට පිළිකුලක්ය. අමාවකද, සබත් දවසද, සභා රැස්කිරීම ද එසේමය. දුෂ්ඨකම සහිත මංගල්‍ය රැස්වීම මට ඉවසන්ට බැරිය."** (යෙසායා 1:13) **"නුඹලාගේ අත්විදහන කල මාගේ ඇස් නුඹලාගෙන් සඟවාගන්නෙමි. එසේය. නුඹලා යාච්ඤා බොහෝවයක් කරන කල්හීත් මම නොඅසන්නෙමි. නුඹලාගේ අත් ලෙයින් පිරී තිබේ. නුඹලා සෝදාගෙන පවිත්‍ර වෙයල්ලා. නුඹලාගේ ක්‍රියාවල නපුරුකම මාගේ ඇස් ඉදිරියෙන් පහකර නපුරුකම් කිරීමෙන් වැලකියල්ලා. යහපත්කම් කරන්ට ඉගෙනගනිල්ලා යුක්තිය සොයා බලාත්කාරය වැඩපවත්වාපල්ලා. මව්පියන් නැත්තාට යුක්තිය කර වන්දඹුවගේ නඩුව අසාපල්ලා."** (යෙසායා 1:15-17) අද දවසේ මූලික වශයෙන් අවශ්‍යවන්නේ පසුතැවිලිවීම සහ දෙවියන් වහන්සේවෙතට හැරීම, උන්වහන්සේගේ ක්‍රිස්තුස් වහන්සේ වෙතට සහ උන්වහන්සේගේ වචනය වෙතට හැරීමයි. කිතුණුවන් දිනපතා යාච්ඤා කළ යුතුය. සෑම පැයකට වරක්වත් ඔවුන්ගේ නායකයන් සහ ඔවුන්ගේ ජාතිය උදෙසා යාච්ඤා කළ යුතුය. දෙවියන් වහන්සේ දයාවන්තව සහ පසුතැවිලිවීමට අපට මඟපෙන්වමින් සිටින සේක. (1 තිමෝති 2:1-2, රෝම 2:4-5) **"ඉර, සඳ හා තාරකාවන් කෙරේ ලකුණු හා මුහුදෙත් රැළ ගැසීමෙන් ඝෝෂාව නිසා වන වියවුලින් පොළොවේ ජාතීන්ට දුක් වේදනා වන්නේය."** (ලූක් 21:25) එය අවුරුද්දෙන් අවුරුද්ද නරක අතට (තත්ත්වයට) වර්ධනය වේ. ඒ අතර තවත් බොහෝ සලකුණු සහ අඟවාදීම් සමඟ ක්‍රිස්තුස් වහන්සේගේ නැවත පැමිණීම ආසන්නව තිබේ.

කිතුණුවන් තමන්ගේ ස්වාමීන් වහන්සේට උන්වහන්සේගේ සේවයට ඔවුන්ගේ උපරිමයෙන් ඔවුන්ගේ ජීවිත අළුතින් කැප කළයුතුයි. **"දුර්වලයන් දිනාගන්නා පිණිස දුර්වලයන්ට දුර්වලයෙක් වුණෙමි. සියලු ආකාරයෙන්ම සමහරෙකු ගළවන පිණිස මම සියල්ලන්ට සියල්ල වුණෙමි."** (1 කොරින්ති 9:22)

# පසුතැවිලිවීම යනු කුමක්ද ... ?

**ජිප්ස් ස්මිත් විසිනි**

පුරුෂයෙක් හෝ ස්ත්‍රියක් කිතුණු ජීවිතයක් ගත කිරීමට උත්සාහ කරන්නේ නම් සහ ඒ තුළ ප්‍රීතියක් නැත්නම් ජයග්‍රහණයක් නැතිනම්, ඒ තුළ ගීතිකාවක් නොමැති නම් මම ඊට හේතුව දනිමි. ඊට හේතුව ඔවුන් පසුතැවිලි නොවීමයි. ඔවුන් වැරදියට ආරම්භ කර ඇත.

අලුත් ගිවිුමේ දේවධර්මය තුළ ඇති පසුතැවිලිවීම බොහෝ අතපසු කරන්නා වූ, බොහෝ දෙනා අතරේ ජනප්‍රිය නොවූ දේවධර්මයක් බවට පත්ව තිබේ. පසුතැවිලිවීමට කැඳවනවාට මනුෂ්‍යයන් කැමති නැත. එමෙන්ම එය නිතර දේශනාකරනවා ඇසෙන්නේ ද නැත. නමුත් ඒ අතරම බයිබලය පසුතැවිලීමේ අත්පොතකි. එය පසුතැවිලිවීම ක්‍රියාත්මක කිරීමට බලකරයි. අණකරනු ලබයි. අයිතියක් වශයෙන් ඉල්ලා සිටියි. පසුතැවිලිවීම වෙනුවට වෙනත් ආදේශකයක් පිළිගනු ලබන්නේ ද නැත.

ශුද්ධ ලියවිල්ලේ හැට වාරයකට වඩා පසුතැවිලිවීමට බලකර සිටියි. එමෙන්ම සෑම යැවුම් පත්‍රයකම මනුෂ්‍යයන්ට පසුතැවිලිවිය යුත්තේ කෙසේදැයි ලියා ඇත. එම නිසා පසුතැවිලිවීමේ අදහස කුමක්දැයි ව්‍යාකූල තත්ත්වයට පත්වීමට කිසිවෙකුට අවශ්‍යය නැත. එසේ වුවත් අති විශාල සෙනඟක් පසුතැවිලවීම පිළිබඳව ව්‍යාකූළ තත්ත්වයකට පත්ව සිටිති.

ව්‍යාජ පසුතැවිලිවීම යනු ව්‍යාජ කිතුණු ජීවිතයකි. ඒ හේතුවෙන් බොහෝ සභාවල නිතරම ප්‍රීතිය සහ ශුද්ධාත්මයාණන් වහන්සේගේ සමාදානය තුළ පවතින්නේ නැත. මක්නිසාද ඔවුන් ශුද්ධ ලියවිල්ලට කීකරු වී නොමැත. **"කාලය සම්පූර්ණ විය. දෙවියන් වහන්සේගේ රාජ්‍යය සමීපය පසුතැවිලි ශුභාරංචිය අදහා ගනිල්ලා යයි කී සේක."** (මාර්ක් 1:15)

පසුතැවිලිවීම යනු කුමක්දැයි ඔබ ඇසිය හැකිය. එය පාපය වැටහීම නොවේ. පාපය ගැන වැටහීම පසුතැවැලිවීමේ මූලිකාංගයකි. ඒ නිසා පාපය ඒත්තු ගන්නේ නැතිව ඔබට පසුතැවිලිවිය නොහැකිය. කිසිවෙක් තමන් වරදකරුවෙක් බව අබෝධකර ගන්නා තුරු පසුතැවිලි වන්නේ නැත. නමුත් වරදකරුවන් වූ සියල්ලන් පසුතැවිලි වන්නේ ද නැත.

ඉතිරි කොටස නොවැම්බර් කලාපයෙන් බලන්න.

## වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සූදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම වේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 47 දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.